# 2018 සංවර්ධන ඉලක්කයන්
# 2017 සංවර්ධන ප්‍රගතිය

## ප්‍රධාන අමාත්‍ය

**මුදල් ක්‍රමසම්පාදන නීතිය හා සාමය**
**සැලසුම් ඉංජිනේරු සේවා සෞඛ්‍ය දේශීය වෛද්‍ය**
**පළාත් පාලන ප්‍රවාහන හා සංචාරක අමාත්‍යාංශය**
**දකුණු පළාත**










# දැක්ම

## ශ්‍රී ලංකාවේ හොඳම
## පළාත් ප්‍රධාන අමාත්‍යාංශය
## දක්ෂිණ දේශයෙන්

## මෙහෙවර ප්‍රකාශය

ජාතික පිළිවෙත් අනුයමින්
දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ
ප්‍රතිපත්ති සම්පාදනය
සැලසුම්කරණය සහ සැලසුම් ක්‍රියාත්මක කිරීම
සඳහා
අනුබද්ධ ආයතන සමායෝජනයෙන් හා
අධීක්ෂණයෙන්
දක්ෂිණ දේශයේ ප්‍රජාවට ප්‍රශස්ත සේවාවක්
සම්පාදනය කිරීම

# මාණ්ඩලික නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය



ප්‍රධාන අමාත්‍යාංශයට අයත් ආයතනවල මාණ්ඩලික නිලධාරීන් සඳහා
ධාරිතා සංවර්ධන වැඩසටහනක් වාර්ෂිකව පැවැත්වේ.
2017 වර්ෂයේ වැඩසටහන
පැල්ගහතැන්න කළමනාකරණ පුහුණු ආයතනයේදී පවත්වන ලදී.
මෙහිදී අමාත්‍යාංශයට අයත් සියළුම විෂයයන් සඳහා
2018 වසරට ඉදිරි සැලසුම් සකස් කරන ලදී.



## දකුණු පළාත් ප්‍රධාන ඇමතිතුමාගේ
## සුභ පැතුම් පණිවිඩය

සත්වන දකුණු පළාත් සභාවේ සිව්වන වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත්වී එය සමස්ථ පළාත් සභාවේ අවධානයට යොමු වී ඒ පිළිබඳ සාකච්ඡාවට ලක්වන අවස්ථාවේ ප්‍රධාන අමාත්‍යාංශයේ සංවර්ධන ප්‍රගතීන් හා ක්‍රමෝපායන් පිළිබඳව මෙම ලුහුඬු සාර සංග්‍රහය මගින් මනාව විදහා දක්වනු ලැබේ.

මෙවර ඉදිරිපත් කර ඇති දකුණු පළාත් සභාවේ 2018 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශනය තුළින් පළාත් සභාවේ ඉලක්කගත සමාජ ආර්ථික ජයග්‍රහණ පිළිබඳ විග්‍රහ කොට ඇත. කෙසේ නමුත් ලියවිල්ලකින් ඉදිරිපත් කරන ඉලක්ක හා අයවැය අරමුණු සාක්ෂාත් කර ගැනීම හුදු ඉදිරිපත් කිරීමකට වඩා අසීරු හා භාරදූර වගකීමකි. ඒ සඳහා අදාල සෑම පර්ශ්වයකම දැඩි කැපවීම, උනන්දුව හා කාර්යක්ෂමභාවය නිරන්තරයෙන්ම අවශ්‍ය වේ.

මිලියන 2.5 ක ජනතාවක් ජීවත්වන වර්ග කි.මී. 5444 ක භූමි ප්‍රමාණයක් සහිත දකුණු පළාත දිවයිනේ අනෙක් පළාත් වලට වඩා දළ ජාතික නිෂ්පාදනයට ඉහළ දායකත්වයක් දක්වන බව මහජන බැංකු වාර්තා අනුව පෙනී යයි.

පළාත් සංවර්ධන ක්‍රියාදාමයේදී අප වෙත නිරන්තර මග පෙන්වීම් කරමින් හා නිසි උපදේශනයන් ලබා දෙමින් අපට මහත් ශක්තියක් හා දිරියක් ලබාදෙන දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර ආචාර්ය හේම කුමාර නානායක්කාර මැතිතුමා විශේෂිතව මෙහිලා ගෞරවයෙන් යුතුව සිහිපත් කරමි.

පළාතේ ආර්ථික හා සමාජීය සංවර්ධන ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාමේදී විශිෂ්ඨ දායකත්වයක් මෙන්ම නායකත්වයක් ලබාදෙමින් කටයුතු කරන දකුණු පළාත් ප්‍රධාන ලේකම් ආර්. සී. ද සොයිසා මහතාටත් එතුමාගේ කාර්ය මණ්ඩලයටත් මගේ ස්තුතිය පුදකර සිටිමි. එසේම අප අමාත්‍යාංශ ලේකම් සමන් දර්ශන පාඩිකෝරාළ මහතා අපගේ සියළු සංවර්ධන ක්‍රියාදාමයන් නිසි ලෙස කළමනාකරණය කරමින් සමස්ථ කාර්ය මණ්ඩලයනට නායකත්වය සපයමින් සලසන්නාවූ ප්‍රශස්ථ මෙහෙවර මම මහත්සේ අගයමි.

අපගේ ඉදිරි සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සෑම පාර්ශ්වයකින්ම අපේක්ෂිත සක්‍රීය දායකත්වය හා කැපවීම මම උදක්ම අපේක්ෂා කරමි. සෞභාග්‍යමත් දකුණ වඩාත් සමෘද්ධිමත් දේශයක් කරා මෙහෙයවීම සඳහා අප සෑම සියළු අපේක්ෂාවක්ම සාකල්‍යයෙන් සඵල වේවායි හෘදයාංගමව ප්‍රාර්ථනා කරමි.

ෂාන් විජයලාල් ද සිල්වා
ප්‍රධාන අමාත්‍ය - දකුණු පළාත

# අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවිඩය



"සෞභාග්‍යමත් දකුණ අභිමානයෙන් ඉදිරියට" තේමාව පෙරදැරිව දකුණු පළාතේ ජනතාවට කාර්යක්ෂම වූත් ඵලදායී වූත් සේවාවක් සැපයීම අප අමාත්‍යාංශයේ අරමුණයි.

මේ යටතේ ප්‍රධාන අමාත්‍යාංශයේ විෂය පථයට අයත් දෙපාර්තමේන්තු හා ආයතන මෙහෙයවීම සම්බන්ධීකරණය හා අධීක්ෂණය කරමින් දකුණු පළාතේ ජනතාවට කාර්යක්ෂම, ඵලදායී, ප්‍රශස්ත සේවාවක් සැපයීම මෙම අමාත්‍යාංශයේ

මේ සඳහා දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලය, ගරු මන්ත්‍රී මණ්ඩලය, ප්‍රධාන ලේකම්තුමා, ආණ්ඩුකාර ලේකම්තුමා, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තුමා, සභා ලේකම්තුමා, අමාත්‍යාංශ ලේකම්වරු, අනෙකුත් දෙපාර්තමේන්තු සහ ආයතන ප්‍රධානීන් සමඟ සහයෝගයෙන් ද අවශ්‍ය අවස්ථාවල දී උපදෙස් ලබා ගනිමින් ද ක්‍රියා කරමි.

ශ්‍රී ලංකාවේ හොඳම පළාත් ප්‍රධාන අමාත්‍යාංශය දක්ෂිණ දේශයෙන් බිහිකිරීමේ දැක්ම අනුව යමින් අඛණ්ඩව තෙවන වරටත් ජාතික ඵලදායිතා සම්මාන තරගාවලියෙන් අමාත්‍යාංශ අතරින් දෙවන ස්ථානයටත්, **ISO 9001:2008** තත්ත්ව සහතිකය ලබාගනිමින් ද, 2016 හා 2017 වර්ෂයන්හි දකුණු පළාත් ක්‍රීඩා ශූරතාවය ලබා ගනිමින්ද, යටත් ආයතයන්හිද සහයෝගය ලබා ගනිමින් ද, අමාත්‍යාංශයෙන් දක්ෂිණ දේශයේ ජනතාවට තම සේවාව වඩාත් කාර්යක්ෂම හා ඵලදායි ලෙසින් ලබාදීමට කටයුතු කරනු ලබයි.

අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු සඳහා ආයතන මගින් අදාල විෂය තුළින් ජනතාවගේ සෞඛ්‍ය, ජන ජීවිතය නංවාලීමේ අරමුණින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර ඒ නිසාම ජාතික මට්ටම හා සැසඳූ විට දකුණු පළාත් සෞඛ්‍ය දර්ශක යහපත් මට්ටමක පවත්වා ගනිමින් බෝවන රෝග පාලන කරමින් ජනතාවගේ එදිනෙදා ජීවිතයට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කරමින් මෙන්ම ජනතාවට වඩාත් සමීප සේවාවක් සපයනු වස් විවිධ වූ ග්‍රාමීය වැඩසටහන් සංවිධානය කරමින් අමාත්‍යාංශ කාර්ය භාරය මනාව ඉටුකරනු ලබයි.

කුඩා දරුවන්ගේ සිට වැඩිහිටියන් දක්වා සියළුම පාර්ශ්ව ආවරණය වන පරිදි අවධානය යොමු කිරීමට ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ආශිර්වාදය මත අමාත්‍යාංශය කටයුතු කර ඇත. පෝෂණ උදාන, සිසු මන සුව, නෙත්පහන්, සූදානමින් අවධානම හඳුනමු, සහනය, මව් සමාජ වැඩසටහන්, දක්ෂිණ ජීවනී, සදර්ශ ගම්මානය, රිය සහකරු මග සුමිතුරු, නිල නියමු ප්‍රභා හරසර, වැඩිහිටි බක්මහ උළෙල වැනි වැඩසටහන් හරහා ජනතාවට සමීපවූ සේවාවන් සැපයීමට දකුනු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය කටයුතු කරනු ලැබේ.

මේ සියලූ ජයග්‍රහණ ලබා ගැනීමට අප දිරිමත් කළ සියළු දෙනාටම මාගේ හද පිරි ස්තුතිය පිරිනමන අතර, 2018 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන් ක්‍රියාත්මක කර ගැනීමට ඔබ සැමගේ සහයෝගය අපේක්ෂා කරමි.


සමන් දර්ශන පාඩිකෝරාළ
ලේකම්,
දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය

# පටුන


| | | |
|---|---|---|
| 01. | දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය | 01 - 23 |
| 04. | දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | 24 - 34 |
| 05. | දකුණු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව | 35 - 42 |
| 06. | දකුණු පළාත්, පළාත් පාලන දෙපාර්තම්න්තුව | 43 - 51 |
| 07. | දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය | 52 - 60 |
| 08. | දකුණු පළාත් රුහුණු සංචාරක කාර්යාංශය | 61 - 69 |
| 09. | දකුණු පළාත් සංවර්ධන අධිකාරිය | 70 - 80 |
| 10. | දකුණු පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 81 - 83 |

# දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය

**නීතිය හා සාමය, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පළාත් පාලන, ප්‍රවාහන හා සංචාරක අමාත්‍යාංශය**



## කාර්යය භාරය

| | | |
|---|---|---|
| 01 | සෞඛ්‍ය | රෝග නිවාරණය හා ප්‍රතිකර්ම වැඩිදියුණු කිරීම තුළින් ප්‍රජාවගේ සෞඛ්‍ය මට්ටම ජාතික හා ජාත්‍යන්තර දර්ශක ලඟා කරවීම තුළින් සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහිකිරීම |
| 02 | දේශීය වෛද්‍ය | දේශීය ආයුර්වේද ක්‍රම සංරක්ෂණය කරමින් ජාතික හා ජාත්‍යන්තර මට්ටමට දේශීය සෞඛ්‍ය ප්‍රචලිත කරමින් නිරෝගී ජනතාවක් බිහි කිරීම |
| 03 | පළාත් පාලන | උපතේ සිට මරණය දක්වා නොව උපන් දිනට පෙරත්, මරණයෙන් පසුවත් මහජනතාවට අවශ්‍ය විවිධ වූ සේවාවන් සපයමින් පළාතේ ජනතාවගේ සුබ විහරණය සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම |
| 04 | මඟී ප්‍රවාහන | දකුණු පළාතේ මඟී ජනතාව සඳහා ප්‍රවාහන සේවාව වැඩි කාර්යක්ෂමතාවයකින් යුතුව සැපයීම හා දකුණු පළාතේ ඓතිහාසිකහා අධ්‍යාපනික වටිනාකමකින් යුතු ස්ථාන ජාලගත කර දක්ෂිණ දේශයේ ප්‍රජාවට කෘතහස්ත සේවයක් සැලසීම |
| 05 | රුහුණු සංචාරක | දකුණේ සංචාරක කර්මාන්තයට සෘජු දායකත්වයක් ලබාදෙන ආකර්ශනීය ස්ථාන වැඩිදියුණු කිරීම හා සංවර්ධනය කිරීම තුළින් දෙස් විදෙස් සංචාරකයන්ගේ ආකර්ශනය ලබාගනිමින් දකුණු පළාතේ ආර්ථික හා සමාජ සංවර්ධනයට දායක වීම |
| 06 | සංවර්ධන අධිකාරිය | පළාතේ කෘෂිකාර්මික, කාර්මික හා සේවා යන අංශයන්හි වටිනාකම ඉහළ නැංවීම සඳහා යෝග්‍ය වැඩසටහන් නිර්මාණය කොට ක්‍රියාත්මක කරමින් දකුණු පළාතේ ආර්ථික හා සමාජ සංවර්ධනයට දායක වීම |
| 07 | මෝටර් රථ ප්‍රවාහන | පළාත් අරමුදල් සම්පාදනයට ක්‍රමවත් ආදායම් රැස් කිරීම තුළින්, නවීන පහසුකම් භාවිතා කරමින්, මෝටර් රථ හිමියන්ට සහාය ලබාදීම |
| 08 | නීතිය හා සාමය | පළාත තුළ නීතිය සාමය සුරක්ෂිත කිරීම සඳහා සාමාන්‍ය ජනතාවගේ ආරක්ෂාව සහතික කිරීමට සිවිල් පාලනයට සහාය ලබාදීම සඳහා සමථ මණ්ඩල, සාමදාන විනිශ්චකාරවරුන්, යනාදී සමාජ කණ්ඩායම් වල ධාරිතා ශක්තිය වැඩි දියුණු කිරීම |

# නෙත්පහන්





නියාගම අක්ෂි සායනය

ඇසේ සුද හේතුවෙන් අන්ධවීමේ අවධානමට ලක්ව සිටින දකුණු පළාතේ අඩු ආදායම්ලාභී රෝගීන් අන්ධ බවින් මුදවීම ප්‍රධාන අරමුණ කොට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. රජයේ රෝහල්වල පොරොත්තු ලේඛනයේ දිගු කලක් රැඳී සිටීම, පෞද්ගලික අංශයේ විශාල මුදලක් වැයවීම යන තත්වයන්ට ලක් නොවී මෙම වැඩසටහන තුළින් කඩිනමින් හා ඵලදායි ලෙස තම ඇස් පෙනීම ලබාගැනීමට දකුණේ අඩුආදායම්ලාභී වැඩිහිටියන්ට අවස්ථාව උදාකර ඇත.

මේ වන විට ගාල්ල දිස්ත්‍රික්කයේ නියාගම අම්බලන්ගොඩ, වැලිවිටිය දිවිතුර, ගෝනපීනුවල, ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි, මාතර දිස්ත්‍රික්කයේ පස්ගොඩ, කඹුරුපිටිය, තිහගොඩ, මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයහි ද ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව හඳුනාගත් රෝගීන් 973 දෙනෙකු සඳහා කාච හා ඖෂධ සපයා කරාපිටිය, සීදුව විජයකුමාරතුංග රෝහල, කඩවත හා වත්තල සිංහ රෝහල් සහ ගොතටුව සුවනෙත රෝහල ආදී රෝහල් වලදී ශල්‍යකර්ම සිදුකර ඇත. දෙසැම්බර් අවසන් වන විට ඇසේ සුද සහිත රෝගීන්ගේ අක්ෂි ශල්‍යකර්ම 1000 ඉක්මවා සිදු කිරීමට හැකිවන අතර 2018 වර්ෂය තුළ අඩු ආදායම්ලාභීන් 1500 ක් සඳහා ශල්‍යකර්ම කිරීමට අපේක්ෂිතය.

එමෙන්ම අඩු ආදායම්ලාභී කණ්නාඩි අවශ්‍ය පිරිස සඳහා කණ්නාඩි ලබා දීම මෙම වැඩසටහනේ තවත් අපේක්ෂාවක් වන අතර මේ වන විට 470 දෙනෙකු සඳහා ඇස් කණ්නාඩි ලබාදී ඇත.

# සිදුකරන ලද සායන හා ශල්‍යකර්ම







සුවනෙත හා වත්තල සිංහ රෝහල් වල අක්ෂි ශල්‍යකර්ම

| වර්ෂය | සායන සංඛ්‍යාව | සායන සඳහා සහභාගීත්වය | හඳුනාගත් රෝගීන් සංඛ්‍යාව | සිදුකල ශල්‍යකර්ම සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 2016 | 03 | 1769 | 529 | 212 |
| 2017 | 06 | 2780 | 1147 | 711 |
| එකතුව | 09 | 4549 | 1676 | 973 |

# ඇස් කණ්නාඩි ලබාදීම





අම්බලන්ගොඩ ඇස් කණ්නාඩි බෙදාදීම



## බස් රථය මිලදී ගැනීම

| වර්ගය | මුදල රු. මිලියන |
|---|---|
| ආසන 34 බස්රථය | 7.9 |

| | තෝරාගත් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය | ලබාදුන් කණ්නාඩි සංඛ්‍යාව |
|---|---|---|
| 01 | නියාගම | 131 |
| 02 | වැලිවිටිය දිවිතුර | 140 |
| 03 | කටුවන | 139 |
| 04 | අම්බලන්ගොඩ | 60 |
| | එකතුව | 470 |

## Operating Microscope උපකරණ ලබාදීම

| | රෝහල | මුදල රු. මිලියන |
|---|---|---|
| 01 | කඹුරුපිටිය මූලික රෝහල | 1.95 |
| 02 | ඇල්පිටිය මූලික රෝහල | 1.95 |
| 03 | බලපිටිය මූලික රෝහල | 1.95 |

# මව් සෞඛ්‍ය සමාජ සංවර්ධන වැඩසටහන



නිල ඇඳුම් බෙදාදීම - සිරිධම්ම විද්‍යාලය, ලබුදූව

සෞඛ්‍ය පණිවුඩ ජනතාව අතරට ගෙනයමින් නිරෝගිමත් සෞඛ්‍ය සම්පන්න ජනතාවක් දකුණු පළාත තුල බිහිකරලීම අරමුණ ඇතිව සෑම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසයකම සෑම ග්‍රාම නිලධාරී කොට්ඨාසයකම අවම වශයෙන් එකක් වන සේ මව් සෞඛ්‍ය සමාජ පිහිටුවා ඇති අතර මේ වන විට දකුණු පළාතේ මව් සෞඛ්‍ය සමාජ 1995 ක් හා එහි සාමාජිකාවන් 23,679 ක් සාමාජිකත්වය දරයි.

මව් සෞඛ්‍ය සමාජ සාමාජිකාවන් සඳහා සෞඛ්‍ය පුහුණු වැඩසටහන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාස මට්ටමින් පවත්වමින් ඔවුන් දැනුමින් පෝෂණය කර ඔවුන් හරහා සෞඛ්‍ය පණිවුඩ ජනතාව වෙත ලබා දීම සිදුකරනු ලබයි.ඔවුන් විසින් සිදු කරනු ලබන මෙම සමාජ සත්කාරයට රුකුලක් වෙමින් සහ 2012 වර්ෂයේ දී සාමාජිකාවන් සඳහා ලබා දී ඇති නිල ඇඳුම මේ වන විට භාවිතයට අපහසු බැවින් හා නව සාමාජිකාවන් අළුතින් මෙම වැඩසටහනට ඇතුලත් වී ඇති බැවින් 2017 වර්ෂයේ දී සෑම මව් සෞඛ්‍ය සමාජ සාමාජිකාවක් සඳහා නිල ඇඳුමක් ලබා දී ඇත.



# ප්‍රජා දායකත්වය ඇතිව සනීපාරක්ෂිත වැසිකිළි ඉදිකිරීම



හම්බන්තොට දිස්ත්‍රික් ආධාර ලබාදීම

දකුණු පළාතේ වැසිකිළි නොමැති මව් සෞඛ්‍ය සමාජ සමාජිකාවන් සඳහා 2017 වසරේ වැසිකිළි 200 ක් ඉදිකිරීමට අපේක්ෂිතය. ප්‍රජා දායකත්වය සහිතව ඉදිකරනු ලබන මෙම සනීපාරක්ෂිත වැසිකිළියක් සඳහා රු.30,000 ක ආධාර මුදලක් අදියර දෙකක් යටතේ ලබා දේ. ප්‍රතිලාභීන් තෝරාගැනීම හා ඉදිකිරීම් අධීක්ෂණය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් හා මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් විසින් සිදුකරනු ලබයි.



මාතර දිස්ත්‍රික් ආධාර ලබාදීම

# ශිෂ්‍යත්ව වැඩසටහන






ශිෂ්‍යත්ව ලබාදීම - වැලිගම නගර සභා ශාලාව

මව් සෞඛ්‍ය සමාජ සාමාජිකාවන්ගේ විභාග සමත් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වලට පිටුවහලක් වෙමින් ඔවුන් ඇගයීමට ලක්කරමින් ඔවුන්ගේ අනාගත අධ්‍යාපන කටයුතු සාර්ථක කරගැනීම අරමුණ ඇතිව ශිෂ්‍යත්ව ආධාර ලබා දීමේ වැඩසටහනක් සිදුකරනු ලබන අතර ඒ යටතේ පහ වසර ශිෂ්‍යත්වය සමත්, අ.පො.ස. සා/පෙළ ,අ.පො.ස. උ/පෙළ හා විශ්ව විද්‍යාල සුදුසුකම් ලබා ඇති දරුවන් සඳහා ශිෂ්‍යත්ව ආධාර ලබා දීමද සිදුකරනු ලබන අතර 2015 වර්ෂයේ විභාගය සමත් දරුවන් සඳහා රු. මිලියන 1.5 වියදමින් ශිෂ්‍යත්ව 252 ක් ද, 2016 වර්ෂයේ විභාගය සමත් දරුවන් සඳහා රු. මිලියන 1.6 වියදමින් ශිෂ්‍යත්ව 277 ක් ලබා දී ඇත.

# මව් සෞඛ්‍ය සමාජ නායිකාවන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන







දකුණු පළාත තුළ පිහිටුවා ඇති මව් සෞඛ්‍ය සමාජවල නායිකාවන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහනක් පැවැත්වීම තුළින් ඔවුන් දැනුමින් පෝෂණය කර ඔවුන් හරහා මව් සමාජිකාවන් දැනුවත් කර සියළුම මව් සෞඛ්‍ය සාමාජිකාවන් හරහා ග්‍රාමීය ජනතාව දැනුවත් කරමින් සෞඛ්‍ය පණිවුඩය ප්‍රජාව වෙත ලබාදීම තුළින් බෝවන හා බෝ නොවන රෝග අවම කිරීම, ළමා අපචාර ඉවත් කිරීම, ළමා හා මාතෘ පෝෂණය සුරක්ෂිත කිරීම හා විවිධ සෞඛ්‍ය වැඩසටහන් හා ප්‍රජා මූල වැඩසටහන් සිදුකිරීම තුළින් නිරෝගිමත් ජනතාවක් දකුණු පළාත තුළ බිහිකිරීම මෙම වැඩසටහනේ මුඛ්‍ය පරමාර්ථය වන අතර මේ වන විට ගාල්ල දිස්ත්‍රික්කයේ සියලුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල ආවරණය වන පරිදි වැඩසටහන් 6 ක් පවත්වා ඇත. මාතර හා හම්බන්තොට දිස්ත්‍රික් තුළ ද මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

# පෝෂණ උදාන



මාතර දිස්ත්‍රික් වැඩසමහන

පෝෂණ ඌණතාවයද දකුණු පළාතේ ප්‍රමුඛ සෞඛ්‍ය ගැටළුවකි. ළදරු හා ළමා මන්දපෝෂණ තත්ත්වය දරුවන්ගේ වර්ධනය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරයි.

අවුරුදු 1-5 වයස් කාණ්ඩයේ දරුවන්ගේ මන්දපෝෂණය සැලකිය යුතු මට්ටමකට අඩු කිරීම උදෙසා නිවැරදි පෝෂණ ක්‍රමවේද පිළිබඳව පෝෂණය පිළිබඳ විශේෂ දැනුම සහිත වෛද්‍යවරුන් මගින් දෙමාපියන් දැනුවත් කිරීමත් අඩු ආදායම් ලාභී මන්දපෝෂණ තත්ත්වයේ පසුවන දරුවන් අරමුණු කර ගෙන මසකට රු. 1000 බැගින් වූ වියළි සලාක මාස 6ක් කාල පරිච්ඡේදයක් සඳහා ලබාදීමත් සිදුවේ.

මේ වන විට දකුණු පළාතේ දිස්ත්‍රික්ක 3 හි දරුවන් 3265 ක් සඳහා ප්‍රතිලාභ ලබාදී ඇත. අදියර 04 ක් මේ වන වට පවත්වා අවසන් අතර දෙසැම්බර් මස මාතර හම්බන්තොට දිස්ත්‍රික්කවල තවත් දරුවන් 500 දෙනෙකුට ප්‍රතිලාභ ලබාදීමට අපේක්ෂිතය. 2018 වසරේ 2000 දෙනෙකුට පමණ ප්‍රතිලාභ ලබාදීමට අපේක්ෂිතය.

## වියළි සලාක ලබාදුන් ප්‍රතිලාභීන් ගණන

| | ස්ථානය | 2015 | 2016 | 2017 | එකතුව |
|---|---|---|---|---|---|
| 01 | ගාල්ල | 551 | 210 | 770 | 1531 |
| 02 | මාතර | 275 | 250 | 425 | 950 |
| 03 | හම්බන්තොට | 250 | 237 | 297 | 784 |
| | එකතුව | 1,076 | 697 | 1,492 | 3,265 |

# දක්ෂිණ ජීවනී




යහපත් සෞඛ්‍ය තත්ත්වයන් පවත්වා ගැනීමට දරුවා තුළ තිබිය යුතු දැනුම ඔවුන් තුළ තැන්පත් කිරීම සඳහා සිත් ගන්නා සුළු ආකාරයෙන් නිර්මාණය වූ දක්ෂිණ ජීවනී වැඩසටහන මගින් බෝවන රෝග,  බෝ නොවන රෝග පිළිබඳව මෙන් ම රෝග බෝවීම පාලනය, ප්‍රථමාධාර, තමා අවට පරිසරය සෞඛ්‍යට හිතකර ලෙස පවත්වා ගැනීම පිළිබඳව ද දරුවාගේ දැනුම පුළුල් වන ලෙස මෙම වැඩසටහන නිර්මාණය කර ඇති අතර වාර්ෂිකව මේ දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලබයි. දැනුම මිණුම තරඟාවලියකින් ඔබ්බට ගොස් දුවා දරුවන්ගේ චිත්‍ර, ගද්‍ය හා පද්‍ය හැකියාවන් ද මැන බැලීම සඳහා විශේෂ ක්‍රියාකාරකම් රැසක් මෙම වැඩසටහනට ඇතුළත් කර ඇත.



### ජයග්‍රාහකයන් සඳහා ලබාදුන් ත්‍යාග ප්‍රමාණයන්

| ශ්‍රේණි කාණ්ඩය | පළාත් ත්‍යාග ප්‍රමාණය | දිස්ත්‍රික් ත්‍යාග ප්‍රමාණය | කලාප ත්‍යාග ප්‍රමාණය | කුසලතා ත්‍යාග ප්‍රමාණය | එකතුව |
|---|---|---|---|---|---|
| 1-5 ශ්‍රේණි කාණ්ඩය | 06 | 12 | 48 | 154 | 220 |
| 6-8 ශ්‍රේණි කාණ්ඩය | 26 | 45 | 138 | 394 | 603 |
| එකතුව | 32 | 57 | 186 | 548 | 823 |

# යසෝරාපුර සදර්ශ ගම්මානය - ගොඩහේන





විවිධ රාජ්‍ය ආයතන හා සිවිල් සමාජය සම්බන්ධීකරණය කරමින් ප්‍රජා මූලික සංවිධාන බලගැන්වීම තුළින් ප්‍රජාවගේ පූර්ණ සහාභාගීත්වය ඇතිව ගම තුළ විස්තීර්ණ **(Comprehensive)** සංවර්ධනයක් ඇති කිරීම අරමුණු කොට ගෙන දකුණු පළාතේ ගාල්ල මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්ක 3 හා තෝරාගත් ගම්මාන 3 ක් ආදර්ශ ගම්මාන ව්‍යාපෘති වශයෙන් සංවර්ධනය කිරීමට අපේක්ෂිතය.

එහි මූලික පියවර ලෙස ගාල්ල දිස්ත්‍රික්කයේ අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ගොඩහේන ග්‍රාම නිලධාරී වසම යසෝරාපුර සදර්ශ ගම්මානය ලෙසින් නම් කරන ලද අතර එම ගම්මානයේ මේ වන විට ආර්ථික, සමාජයීය, සංස්කෘතික, ආධ්‍යාත්මික, සෞඛ්‍ය, සංචාරක ක්ෂේත්‍රයන් ඒකාබද්ධ කොට ගනිමින් සංවර්ධන කටයුතු රාශියක් මේ වන විට ආරම්භ කර ඇත.

අභ්‍යන්තර මාර්ග පද්ධතිය සම්පූර්ණයෙන් සංවර්ධනය කිරීමට සැලසුම්කර ඇති අතර මේ වන විට මාර්ග 7 ක වැඩ සම්පූර්ණයෙන් අවසන්වී ඇති අතර 2017 අවසන්වීමට පෙර ප්‍රධාන මාර්ගය ඇතුළුව තවත් මාර්ග 5 ක් සංවර්ධනය කර අවසන් කිරීමට නියමිතය.

යසෝරාපුර සදර්ශ ගම්මානයේ අඩු ආදායම්ලාභී සනීපාරක්ෂක පහසුකම් නොමැති සියළු දෙනාටම එම පහසුව ලබාදෙමින් සනීපාරක්ෂිත වැසිකිළි 16 ක් ප්‍රජා දායකත්වය ඇතිව ඉදි කර ඇත. සංචාරක ප්‍රවර්ධන කටයුතු, ජීවනෝපාය සංවර්ධන වැඩ සටහන්, සෞඛ්‍ය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වන අතර පොදු ලිං, පොදු සුසානභූමිය සංවර්ධනය ආදී කටයුතු අවසන් කර ඇත.

ඉදිරියේදී ආධ්‍යාත්මික සංවර්ධනයට මූලිකත්වය දෙමින් සියලුම අංග වලින් පරිපූර්ණ වූ ආදර්ශ ගම්මානයක් බවට පත්කර එය ගුරු කොට ගනිමින් අනෙකුත් ආදර්ශ ගම්මාන සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

# සිසු මන සුව









දකුණු පළාතේ යෞවන වයසේ දරුවන්ගේ මානසික සෞඛ්‍ය නැංවීමේ අරමුණින් සුවපත් මනසින් ලෝකය දකිමු තේමාව යටතේ සිසු මන සුව වැඩසටහන දකුණු පළාත පුරා පාසල් දරුවන්, යෞවන වයසේ දරුවන් හා යෞවන වයසේ දරුවන් සිටින දෙමාපියන් ඉලක්ක කොට ක්‍රියාත්මක වේ.

මේ වැඩසටහන තුළ ආදර්ශමත් නාට්‍යයක් හා විශේෂඥ මනෝ වෛද්‍යවරයෙකුගේ දේශනයක්ද අන්තර්ගතය. මේ වන විට දරුවන් 5000 දෙනෙකු පමණ සඳහා වැඩසටහන් 6 ක් පවත්වා ඇත.

මේ තුළින් මත්ද්‍රව්‍ය හා වෙනත් යෞවන දරුවන්ගේ ගැටළු පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් දරුවන්ගේ ප්‍රසාදයට ලක්වූ වැඩසටහනක් නිර්මාණය වී ඇත.

2018 වසර තුළ විශ්ව විද්‍යාල, තාක්ෂණික ආයතන, යෞවන සමාජ හා ස්වේච්ඡා සංවිධාන ඉලක්කකොට ව්‍යාපෘතිය පුළුල්ව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

## සිදුකරනු ලැබූ වැඩසටහන්

| දිනය | ස්ථානය | සහභාගීත්වය |
|---|---|---|
| 2017.08.01 | යක්කලමුල්ල ප්‍රා.ස. ශ්‍රවනාගාරය | 400 |
| 2017.09.25 | කඹුරුපිටිය උපාලි විජයවර්ධන ශාලාව | 1,000 |
| 2017.09.29 | අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයීය ප්‍රධාන ශාලාව | 1,000 |
| 2017.10.09 | ඇල්පිටිය ආනන්ද විද්‍යාලයීය ප්‍රධාන ශාලාව | 1,000 |
| 2017.10.13 | අකුරැස්ස ගොඩපිටිය ජාතික පාසලේ ප්‍රධාන ශාලාව | 600 |
| 2017.10.30 | වීරකැටිය ජාතික පාසලේ ප්‍රධාන ශාලාව | 1,000 |
| | එකතුව | 5,000 |

# සුදානමින් අවධානම හඳුනමු









දකුණු පළාතේ රජයේ නිලධාරීන් හා ආශ්‍රිත ප්‍රජාව පිළිකා අවධානම පිළිබඳව දැනුවත් කිරීමේ අරමුණින් ක්‍රියාත්මක මෙම වැඩසටහන ප්‍රධාන වශයෙන්ම ගාල්ල කරාපිටිය රෝහලේ පිළිකා විශේෂඥ වෛද්‍ය උපුල් ඒකනායක මහතාගේ දේශනයකින් සමන්විතය. දැනට 1500 ක් පමණ සඳහා වැඩසටහන් 4 ක් පවත්වා ඇත.

මෙයට අමතරව අඩු ආදායම්ලාභී පිළිකා රෝගීන්ට අත්වැලක් වීම සඳහා "සහනය" නම්වූ වැඩසටහනක් ද ක්‍රියාත්මක වේ. මෙහිදී අඩු ආදායම්ලාභී පිළිකා රෝගීන් සඳහා මූල්‍යමය සහනයක් ලබාදීම අපේක්ෂා කරයි.

2018 වසරේදී ද අඛණ්ඩව වැඩසටහන් පැවැත්වීමට අපේක්ෂිතය.

## සිදුකරනු ලැබූ වැඩසටහන්

| දිනය | ස්ථානය | සහභාගීත්වය |
|---|---|---|
| 2017.03.17 | දක්ෂිණපාය අමාත්‍යාංශ සංකීර්ණය | 270 |
| 2017.04.28 | මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 263 |
| 2017.07.26 | කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 332 |
| 2017.09.08 | අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 462 |
| | එකතුව | 1,327 |

# දක්ෂිණ මෙහෙවරාභිමානී හරසර



දකුණු පළාතේ ක්ෂේත්‍ර රාජකාරීහි නියුතු මහජන හෙද සොයුරිය, පරිපාලන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනීන්ගේ සේවා ඇගයීම හා ධාරිතා සංවර්ධනය අරමුණු කොට ගනිමින් මෙම වැඩසටහන 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කරනු ලැබීය. මෙහිදී ක්ෂේත්‍ර රාජකාරී දක්ෂතා දැක්වූ 67 දෙනෙකු සඳහා සම්මාන පිරිනැමුණු අතර ක්ෂේත්‍ර රාජකාරී හි නිරත මහජන හෙද සොයුරිය, පරිපාලන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනීන් 866 දෙනෙකු සඳහා රාජකාරී ගමන් බෑගයක් ද ලබාදෙන ලදී.







# නීතිය හා සාමය



නීතිය හා සාමය විෂය ද අයත් අමාත්‍යාංශය ලෙස 2016 වසරේදී උපමාන පාදක ප්‍රතිපාදන යටතේ ග්‍රාම නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන්, **"Principles of Medical Law"** ග්‍රන්ථය වෛද්‍ය සිසුන්ට බෙදාදීම, සාමදාන විනිශ්චය කරුවන්, හදිසි මරණ පරීක්ෂකවරුන් ඇගයීම, මාර්ග අනතුරු පිළිබඳ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත.

2017 වසර තුළදී විශේෂ වැඩසටහන් පැවැත්වීමට කටයුතු යොදන ලදී

## නිල නියමු ප්‍රභා හරසර




ග්‍රාම නිලධාරීන් ඇතුළු ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආශ්‍රිත නිලධාරීන්ගේ සුභ සාධනය සඳහා පහසුකම් සැපයීම ගාල්ල දිස්ත්‍රික් වැඩසටහන 2017 නොවැම්බර් මස 24 දින හෝල් ඩි ගෝල් ශාලාවේදී පවත්වන ලදී.

# රිය සහකරු මග සුමිතුරු




පාසල් රිය නියාමක දරුවන් ඇගයීමේ වැඩසටහනක් වන මෙම වැඩසටහනට අදාලව ගාල්ල දිස්ත්‍රික් වැඩසටහන් තුනක් දෙසැම්බර් මස පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙහිදී මාර්ග නීති රීති පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රයෝගික පුහුණුවක් දරුවන්ට ලබාදෙන අතර අදාල පාසල් සඳහා උපකරණ කට්ටලයක් ලබාදීමටද නියමිතය.

## විශේෂ වැඩසටහන්

2018 වර්ෂයේදී ග්‍රාම නිලධාරීන් ඇගයීම හා ධාරිතා සංවර්ධන වැඩසටහන් "ජනගත නීතිය" ග්‍රන්ථය මුද්‍රණය කර සමාජගත කිරීමට අපේක්ෂා කරයි. එමෙන්ම "රිය සහකරු මග සුමිතුරු" වැඩසටහන පළාත පුරා ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත.

# 2018 අපේක්ෂිත විශේෂිත වැඩසටහන්

## 2017 වසර තුළ ක්‍රියාත්මක විශේෂිත වැඩසටහන් තව දුරටත් සංවර්ධිතව ක්‍රියාත්මක කරන අතර එයට අමතරව

⌘ සිසුමන සුව වැඩසටහන පාසල් සිසුන්, දෙමාපියන්, විශ්ව විද්‍යාල හා රජයේ නිලධාරීන් සඳහා වඩාත් වැඩිදියුණු කර පැවැත්වීම.

⌘ දකුණු පළාතේ වැසිකිලි නොමැති පවුල් සඳහා වැසිකිළි ඉදිකරදීමේ වැඩසටහන පුළුල් කිරීම.

⌘ විශ්‍රාමික ප්‍රජාවගේ කායික, මානසික සෞඛ්‍ය සංවර්ධනය වෙනුවෙන් ඉසිඹු සුව වැඩසටහන.

⌘ දක්ෂිණ ජීවනී වැඩසටහන් නවමු මුහුණුවරකින්

⌘ අමාත්‍යාංශයේ හඳුනාගත් ක්ෂේත්‍ර 5 ක් සඳහා තොරතුරු පද්ධති නිර්මාණය.

⌘ රථවාහන පොලිස් නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන.

⌘ දකුණු පළාතේ ආකර්ශනීය සංචාරක ස්ථාන පිළිබඳව විදේශිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන්

⌘ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් ඇගයීමේ වැඩසටහන්

⌘ හරිත ඵලදායිතා සංකල්පය තුළින් මොන්රෝවියාවත්ත කසල කළමනාකරණ මධ්‍යස්ථානය සංවර්ධනය

⌘ රෝහල් පරිශ්‍ර නඩත්තුව සඳහා පුද්ගලික අංශයේ සහාය ලබාගැනීමේ වැඩසටහන්

# ප්‍රධාන අමාත්‍ය කාර්යාලයීය මෙහෙවරෙන් බිඳක්...




## දක්ෂිණ ලිත

දකුණු පළාතේ ප්‍රධාන පුරවැසියා වශයෙන් තම ආදරණීය ජනතාවට වර්ෂය ආරම්භයේ දක්ෂිණ ලිත සමගින් සුබපැතුම් එක්කිරීම.





## වැඩිහිටි බක්මහ සුහද හමුව

වයස අවුරුදු 55 ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් පවත්වනු ලබන අවුරුදු උත්සවය

## දක්ෂිණ නැණ ප්‍රදීප

5 ශිෂ්‍යත්වයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් පවත්වන විභාග උපකාරක වැඩසටහන

# ප්‍රධාන අමාත්‍ය කාර්යාලයීය මෙහෙවරෙන් බිඳක්...




## උපන්දින සුබපැතුම

දකුණු පළාතේ
ප්‍රධාන පුරවැසියා වශයෙන්
තම ආදරණීය ජනතාවට උපන්දිනය
වෙනුවෙන් උපන්දින සුබපැතුම් පත්
මගින් සුබපැතුම් එක්කිරීම.




## පාසල් දූ දරුවන්ට කාලසටහනක්

අධ්‍යාපනය ලබන සියළුම දරුවන් වෙනුවෙන්
කාලය නිසි ලෙස කළමණාකරනය
කිරීමේ වැදගත්කම අවධාරණය කිරීමට
පාසල් දරුවන්ට කාලසටහන්
ලබා දීමේ වැඩසටහනකි.



## ශිෂ්‍ය ප්‍රතිභා ප්‍රණාම


5 ශිෂ්‍යත්වය සමත්
දූ දරුවන් ඇගැයීමේ
පළාත් මට්ටමේ
එකම වැඩසටහන



## දක්ෂිණ සිඟිති සර

පූර්ව ළමාවිය
සංවර්ධන මධ්‍යස්ථානවල
ඉගෙනුම ලබන දරුවන්ගේ
ළමාවිය සංවර්ධනය
කිරීමේ වැඩසටහන

# ප්‍රධාන අමාත්‍ය කාර්යාලයීය මෙහෙවරෙන් බිඳක්...




## තෙරුවන් ගාථා සහිත පිරුවානා පොත් වහන්සේ

දකුණු පළාතේ බෞද්ධාගමිකයින්ගේ පහන් සංවේගය උදෙසා තෙරුවන් වන්දනා ගාථා සහිතව හා පාළි සිංහල අරුත් ඇති පිරුවානා පොත් වහන්සේ මුද්‍රණය කිරීම

## වෙසක් සුබපැතුම් වැඩසටහන

දකුණු පළාතේ ප්‍රධාන පුරවැසියා වශයෙන් තම ආදරණීය ජනතාවට වෙසක් උත්සවය නිමිති කරගෙන සුබ පැතුම් එක්කිරීම.







## ලේඛකාධාර වැඩසටහන

දකුණු පළාතේ ලේඛන කලාවේ යෙදෙන්නන් දිරිගැන්වීම හා සවිබල ගැන්වීමේ වැඩසටහන

# එළි දක්වන ලද ග්‍රන්ථ




තෙරුවන් වන්දනා ගාථා
සහිතව හා පාළි සිංහල
අරුත් ඇති
ග්‍රන්ථයකි




විවාහාභිමුක
පති පතීන්ට පිරිනමන
උපදේශාත්මක ග්‍රන්ථයකි




දහම් පාසල්
ගුරුවරුන්ට
ඉගැන්නුම් අත් පොතකි





රජයේ සේවක
විභාග සඳහා
අත්වැලකි


# එළි දක්වන ලද ග්‍රන්ථ




පෙර පාසල් දරුවන්ට
සකසන ලද ක්‍රමවත්
වැඩ පොතකි.




දේශීය වෛදකම් ක්‍රම
ඇතුළත්
ග්‍රන්ථයකි




වෛද්‍ය සිසුන් සඳහා
සැකසූ
ග්‍රන්ථයකි




දක්ෂිණ දේශයේ
කිවි කිවිදියන්ගේ නිර්මාණ
ඇතුළත් ග්‍රන්ථයකි

# දකුණු පළාත්
# සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

## දැක්ම

**ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම සෞඛ්‍ය සේවා සපයනු ලබන පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවක් වීම තුළින් නිරෝගී සම්පත්තියෙන් සපිරි සෞභාග්‍යමත් දකුණ අභිමානයෙන් පෙරට ගෙන ඒමට දායක වීම**





විසිපන් ලක්ෂයට අධික වූ ජනතාවට නිරෝගීමත් දිවි පෙවෙතක් ගත කිරීමට අවශ්‍ය පහසුකම් සපුරාලීම දකුණු පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අභිප්‍රාය වේ. දකුණු පළාත සීඝ්‍ර සංවර්ධනයක් කරා ගමන් කරමින් සිටින මේ අවධියේ ජනතාවගේ සෞඛ්‍ය අවශ්‍යතා උපරිම අයුරින් සපුරාලීම තුලින් සංවර්ධනය කරා යන ගමනට විශාල අත්වැලක් සපයනු ලබයි.

පළාත් සෞඛ්‍ය සේවාවේ රෝගී සත්කාරක සේවය හා නිවාරණ සෞඛ්‍ය සේවය ජනතාවට අවශ්‍ය සෞඛ්‍ය පහසුකම් සැලසීමේ ලා ප්‍රමුඛස්ථානයක් ගනී. මූලික රෝහල්, ප්‍රාදේශීය රෝහල් හා ප්‍රාථමික සෞඛ්‍ය සත්කාරක ඒකක මගින් රෝගී සත්කාරක සේවාව සපයයි.රෝග නිවාරණ සෞඛ්‍ය සේවාව පළාතේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශ තුල පිහිටි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල වලින් සහ විශේෂිත ව්‍යාපාර මඟින් සිදු වේ.

ඉහත සේවාවන් සැපයීම සඳහා දකුණු පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව තුල ක්‍රියාත්මක වන ආයතන ව්‍යුහය පසුගිය වසර කිහිපය තුල ක්‍රියාත්මක වූ අනුමත සේවක සංඛ්‍යා සංශෝධනයට අනුව ආයතන සංඛ්‍යාවේ යම් යම් සංශෝධන සිදු වූ අතර ඒ අනුව දකුණු පළාත තුල දැනට ආයතන 207ක් ක්‍රියාත්මක වේ.මේ අතර මූලික රෝහල් 8ක් ද ප්‍රාදේශීය රෝහල් 51ක් ද ප්‍රාථමික වෛද්‍ය සත්කාරක ඒකක 59ක් ද මඟින් පළාත තුල රෝගී සත්කාරක සේවාව ද සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල 49 ක්ද විශේෂිත ව්‍යාපාර 11 ක්ද හා රෝග නිවාරණ සෞඛ්‍ය සේවාව ද සපයනු ලබයි.

# සංවර්ධන කටයුතු සඳහා මූල්‍ය දායකත්වය



බලපිටිය මූලික රෝහල

සෞඛ්‍ය අංශයේ දෙවන සංවර්ධන ව්‍යාපෘතිය(**HSDP II**), පළාත් නිශ්චිත ප්‍රතිපාදන (**PSDG**)සහ උපමාන පාදක(**CBG**) යන මූල්‍ය ප්‍රතිපාදන මඟින් පළාතේ සංවර්ධන කටයුතු සඳහා මූල්‍ය දායකත්වය සපයනු ලබයි.මීට අමතරව රේඛීය අමාත්‍යාංශය මඟින් ද පළාතේ සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන සපයයි. ඉහත සියළු ප්‍රතිපාදන මඟින් ගොඩනැඟිලි ඉදිකිරීම ගොඩනැඟිලි අළුත්වැඩියාව වෛද්‍ය හා අනෙකුත් උපකරණ මිලදී ගැනීම හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මූලිකව සිදු කරයි. රේඛීය අමාත්‍යාංශ ප්‍රතිපාදන රු. මිලියන 239.96 ක් වැය කොට 2016 වර්ෂයේ පළාතේ රෝහල්වල යටිතල පහසුකම් හා උපකරණ සැපයීම් ඉටුකොට ඇත.

2016 වසරේ **PSDG** මිලියන 500, **HSDP** මිලියන 355, **CBG** මිලියන 35 ක් අදාල වැඩසටහන් ක්‍රියාත්මක කල අතර 2017 වසර සඳහා **HSDP** මිලියන 365, **PSDG** මිලියන 170 ක් **CBG** මිලියන 24 ක් සඳහා අදාල වැඩසටහන් ක්‍රියාත්මක වෙමින් පවතී.




රෝහල් වල භෞතික හා මානව සම්පත් බොහොමයක් වැඩි දියුණු කිරීම තුලින් දකුණු පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් රෝහල් වලින් ලබා දෙන සේවාවේ දියුණුවක් දැකිය හැකි අතර විශේෂයෙන් පළාතේ සියළු මූලික රෝහල් වලින් රෝගීන් හට විශේෂඥ වෛද්‍ය සේවාව සපයයි. පළාත සඳහා ලැබෙන ප්‍රතිපාදන උපරිම ලෙස යොදා ගනිමින් ඊට සමගාමීව රෝග විනිශ්චය සඳහා වූ උපකාරක සේවා ද වැඩි දියුණු කර ඇත. මීට අමතරව රෝහල් වල හදිසි සත්කාරක සේවා, ශල්‍යාගාර සහ දැඩි සත්කාරක ඒකක සඳහා අවශ්‍ය උපකරණ රැසක් සෞඛ්‍ය අංශයේ සංවර්ධන සැලැස්ම මඟින් ලබා දී ඇත.


## රෝහල් වල සිදුකරන ලද රෝග විනිශ්චය සේවාවන් සංඛ්‍යාව

| | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| රසායනාගාර පරීක්ෂණ සංඛ්‍යාව | 1541015 | 1548413 | 1760990 | 1732710 | 1943830 |
| ප්‍රධාන සැත්කම් සංඛ්‍යාව | 4573 | 7206 | 7039 | 9698 | 14361 |
| සුළු සැත්කම් සංඛ්‍යාව | 29175 | 31057 | 39917 | 36394 | 43798 |
| පරීක්ෂණ සංඛ්‍යාව | 47453 | 68581 | 76756 | 86274 | 80585 |
| අල්ට්‍රා සවුන්ඩ් පරීක්ෂණ සංඛ්‍යාව | 9840 | 16143 | 22296 | 17073 | 15261 |
| සිදුකරන ප්‍රසූත සංඛ්‍යාව | 14158 | 15045 | 15616 | 13004 | 13720 |


එමෙන්ම පලාත තුල සිටින මහජනතාව වෙත සපයනු ලබන මාතෘ හා ළමා සෞඛ්‍ය කටයුතු බෝ වන රෝග හා බෝ නොවන රෝග පාලනය කිරීමේ කටයුතු සඳහා ද අවශ්‍ය පහසුකම් මෙම ප්‍රතිපාදන මගින් සලසා ඇති අතර එම සේවාවල දියුණුවක්ද දැකිය හැක. එමෙන්ම කාර්ය මණ්ඩලය මෙන්ම මහජනතාව දැනුවත් කිරීම සඳහා විවිධ පුහුණු වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් මෙම ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක වේ.

## මාතෘ හා ළමා සෞඛ්‍ය හා ඩෙංගු කාර්ය දර්ශක


මාතෘ මරණ අනුපාතිකය





ළදරු මරණ අනුපාතිකය






අඩු බර දරු උපත් ප්‍රතිශතය






නව ජන්ම මරණ අනුපාතිකය





අවුරුදු 1-2 අතර දරුවන්ගේ
බර අඩු ප්‍රතිශතය
50
40
30
20
10
2012
2013
2014
2015
2016
වර්ෂය


අවුරුදු 3-5 අතර දරුවන්ගේ
බර අඩු ප්‍රතිශතය
50
40
30
20
10
2012
2013
2014
2015
2016
වර්ෂය



බර අඩු ළදරුවන්ගේ ප්‍රතිශතය
25
20
15
10
5
2012
2013
2014
2015
2016
වර්ෂය


ඩෙංගු මරණ අනුපාතිකය
0.5
0.4
0.3
0.2
0.1
2012
2013
2014
2015
2016
වර්ෂය


අවුරුදු 1-2 අතර දරුවන්ගේ බර අඩු ප්‍රතිශතය





අවුරුදු 3-5 අතර දරුවන්ගේ බර අඩු ප්‍රතිශතය




බර අඩු ළදරුවන්ගේ ප්‍රතිශතය




ඩෙංගු මරණ අනුපාතිකය



# සිසු සුව උදාන



සිසු සුව උදාන වැඩසටහන මගින් දිස්ත්‍රික්කයක එක වැඩසටහන මගින් වසරකට වරක් පවත්වනු ලැබේ. සිසුන්ගේ සෞඛ්‍ය දැනුම ඇගයීම හා ප්‍රදර්ශන හා දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් සිසුන්ගේ දැනුම වර්ධනය කිරීම මෙම වැඩසටහනින් සිදු කෙරේ. දිස්ත්‍රික්කයේම තෝරා ගත් පාසලක මෙම වැඩසටහන පැවැත්වේ. ප්‍රදේශයේම පාසල් දරුවන් මෙම වැඩසටහනට සහභාගී වේ. 2016 වසරේ වැඩසටහන් බද්දේගම, මුලටියන හා වීරකැටිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල බල ප්‍රදේශයන්හි පැවැත්වීය.





# සුව පූජා



සංඝයා වහන්සේලාගේ බෝ නොවන රෝග සම්බන්ධව පරීක්ෂාවට ලක්කර අවශ්‍ය උපදෙස් ලබාදෙන සායන වැඩසටහනකි. 2016 වසරේ වැඩසටහන් තුනක් හබරාදුව, කරන්දෙණිය හා මුලටියන පවත්වා ඇත.

# සුව කැදැල්ල

මෙය යෞවන වයසේ දරුවන් ඉලක්ක කරගෙන පවත්වන වැඩසටහන් මාලාවකි. මෙහිදී එම සංක්‍රාන්ති වයස තුළ පැන නගින ගැටළු හා විවාහ දිවියට ඇතුළත් වීමේදී දැනගත යුතු කරුණු පිළිබඳව අවධානය යොමු කෙරේ. දිස්ත්‍රික්කයකට පහ බැගින් දිස්ත්‍රික්ක තුන සඳහාම වැඩසටහන් පැවැත්වේ.

බද්දේගම, බෝපේ පෝද්දල, හබරාදුව, රත්ගම, වැලිවිටිය දිවිතුර, අකුරැස්ස, දික්වැල්ල ,කඹුරුපිටිය, තිහගොඩ, පස්ගොඩ, අම්බලන්තොට, සූරියවැව, තංගල්ල, තිස්සමහාරාම, වීරකැටිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල බල ප්‍රදේශයන්හි සුව කැදැල්ල වැඩසටහන් පවත්වා ඇත.

# මා පිය මෙහෙවර





විවාහක තරුණ දෙමව්පියන්ගේ පෞද්ගලික, සාමාජීය හා සෞඛ්‍ය ගැටළු වලට මුහුණ දෙන ආකාරය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවකි. දිස්ත්‍රික්කයකට පහ බැගින් දිස්ත්‍රික්ක තුනේම වැඩසටහන් වාර්ෂිකව පැවැත්වේ.

ගෝනපිනුවල, නියාගම, නෙළුව, තවලම, වැලිවිටිය දිවිතුර, අතුරලිය, කැකණඳුර, කොටපොල, මාලිම්බඩ, වැලිගම, අඟුණුකොලපැලැස්ස, හම්බන්තොට, කටුවන, ඔකේවෙල, වලස්මුල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල බල ප්‍රදේශයන්හි මා පිය මෙහෙවර වැඩසටහන් පවත්වා ඇත.

| | ක්‍රියාකාරකම |
|---|---|
| 01 | බලපිටිය වෛද්‍ය නේවාසිකාගාරය වැඩ නිම කිරීම. |
| 02 | කරන්දෙණිය පරිපාලන ගොඩනැගිල්ල වැඩ නිම කිරීම. |
| 03 | උඩුගම දෙමහල් ගොඩනැගිල්ල ආරම්භ කිරීම. |
| 04 | ඇල්පිටිය දැඩි සත්කාර ඒකකය ඉදිකිරීම. |
| 05 | බලපිටිය පල්දෝරු පද්ධතිය අලුත්වැඩියාව |
| 06 | රත්ගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය ඉදිකිරීම ආරම්භ කිරීම. |
| 07 | කඹුරුපිටිය සිව්මහල් ගොඩනැගිල්ලේ ශල්‍යාගාරය හා දැඩි සත්කාර ඒකකයේ ඉතිරි වැඩ නිම කිරීම. |
| 08 | තංගල්ල මූලික රෝහලේ ළමා වාට්ටුවේ ඉතිරි වැඩ නිම කිරීම. |

# දකුණු පළාත්
# ආයුර්වේද දෙපාර්තමේන්තුව

## දැක්ම
**දේශීය වෛද්‍ය ක්‍රමය තුළින් සෞඛ්‍ය සම්පන්න ජන සමාජයක්**






දකුණු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වන්නේ වසර දෙදහස් පන්සියයකට අධික සාඩම්බර ඉතිහාසයකට උරුමකම් කියන දේශීය වෛද්‍ය ක්‍රමය තුළින් ප්‍රජාවගේ සෞඛ්‍ය සංරක්ෂණය තුළින් ශාරීරික හා මානසික සෞඛ්‍යයෙන් හෙබි නිරෝගිමත් ජනතාවක් බිහිකරලීමයි.

රෝග නිවාරණය, ප්‍රතිකාර සේවා සහ ආයුර්වේද ප්‍රවර්ධන කටයුතු පුළුල් කිරීමේ අපේක්ෂාවෙන් දකුණු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් කාලීන සංවර්ධන ක්‍රියාදාමයන් රාශියක් ඉටුකිරීම තුළින් ඵලදායී සේවාවන් සැපයීමට හා ඉහළ ප්‍රගතියක් අත්කර ගැනීම අතිශයින් වැදගත්වේ.

දකුණු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ ආයුර්වේද රෝහල් 10ක්ද මධ්‍යම බෙහෙත් ශාලා 26 ක්ද ජනතාවට ප්‍රතිකාර සේවා සපයනු ලබයි. මේ අතරින් ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් වැඩිදියුණු කරන ලද දිස්ත්‍රික් රෝහල් වන ගාල්ල ආයුර්වේද රෝහල, අපරැක්ක ආයුර්වේද රෝහල සහ බෙලිඅත්ත ආයුර්වේද රෝහල මගින් විශේෂ සේවාවන් රැසක් ක්‍රියාත්මක කරන ලදී.

# 2016 හා 2017 වසර තුළ ලබා ගත් ප්‍රගතිය

## 01. දැනට පවත්වනු ලබන ප්‍රතිකාර සේවා වැඩිදියුණු කිරීම.

| වර්ෂය | 2016 | 2017.08.31 දින දක්වා |
|---|---|---|
| ප්‍රතිකාර ලබාගත් රෝගීන් සංඛ්‍යාව | 521,397 | 390,431 |
| ප්‍රතිකාර ලබාගත් නේවාසික රෝගීන් සංඛ්‍යාව | 4763 | 3872 |

## 02. විශේෂ සායන මඟින් ප්‍රතිකාර සේවා පුළුල් කිරීම.

| වර්ෂය | 2016 | 2017.08.31 දින දක්වා |
|---|---|---|
| විශේෂ සායන මඟින් ප්‍රතිකාර ලබාගත් රෝගීන් සංඛ්‍යාව | 28,706 | 21,483 |

## 03. දිස්ත්‍රික් රෝහල් තුළ පංච කර්ම ප්‍රතිකාර පුළුල් කිරීම

| වර්ෂය | 2016 | 2017.08.31 දින දක්වා |
|---|---|---|
| පංචකර්ම ප්‍රතිකාර ලබාගත් රෝගීන් සංඛ්‍යාව | 3840 | 3283 |

## 04. දුෂ්කර ප්‍රදේශවල ජංගම සායන පැවැත්වීම

| වර්ෂය | 2016 | 2017.08.31 දින දක්වා |
|---|---|---|
| ජංගම සායන සංඛ්‍යාව | 101 | 80 |
| ප්‍රතිකාර ලබාගත් රෝගීන් සංඛ්‍යාව | 11248 | 8540 |

## 05. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව ප්‍රජා සෞඛ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව ප්‍රජා සෞඛ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් 89 දෙනෙකු විසින් දකුණු පළාත තුළ වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර ජනතාව දැනුවත් කිරීම මගින් රෝග නිවාරණ කටයුතු තවදුරටත් පුළුල් කරන ලදී.

| වර්ෂය | 2016 | 2017.08.31 දින දක්වා |
|---|---|---|
| පවත්වන ලද වැඩසටහන් ගණන | 3648 | 2916 |
| සහභාගීවූවන් සංඛ්‍යාව | 41361 | 28522 |

## 06. දිස්ත්‍රික් රෝහල් තුළ ගෙවන වාට්ටු ඒකක ඇති කර එමගින් පළාත් සභාවට ආදායම් උපයාදීම

| වර්ෂය | 2016 | 2017.08.31 දින දක්වා |
|---|---|---|
| ගාල්ල ආයුර්වේද රෝහල | 894,536.00 | 733,778.00 |
| අපරැක්ක ආයුර්වේද රෝහල | 625,392.50 | 390,780.00 |

## 07. ඖෂධ නිෂ්පාදනය

දකුණු පළාත සඳහා ඖෂධ අවශ්‍යතාවය අප විසින්ම සම්පාදනය කර ගැනීමේ මූලික අපේක්ෂාවෙන් 1994 වර්ෂයේදී ආරම්භ කරන ලද බෙලිඅත්ත ඖෂධ නිෂ්පාදන ඒකකය මගින් අත්‍යාවශ්‍ය ඖෂධ වර්ග ඇතුළුව ඖෂධ වර්ග 75 ක් නිෂ්පාදනය කිරීමට හැකිවී ඇත. එමගින් දකුණු පළාතේ රෝහල් හා මධ්‍යම බෙහෙත් ශාලාවන්හි සමස්ත ඖෂධ අවශ්‍යතාවයෙන් 95% කට වැඩි ප්‍රමාණයක් සපුරාලන්නට හැකිවීම අප ලත් විශාල ජයග්‍රහණයකි. එමෙන්ම වෙනත් ආයතන සඳහා නිෂ්පාදිත ඖෂධ අලෙවි කිරීම මගින් ආදායම් උපයාගත හැකි විය.

| වර්ෂය | 2016 | 2017.08.31 දින දක්වා |
|---|---|---|
| ආයුර්වේද රෝහල් සඳහා ලබාදීම | 42,403,981.43 | 34,513,130.10 |
| බාහිර අලෙවි කිරීම | 4,583,862.32 | 908,140.00 |




## 08. සංවර්ධන ව්‍යාපෘති

2015, 2016 වසර තුළ සංවර්ධන ක්‍රියාදාමයන් රාශියක් ඉටුකිරීම තුළින් ඵලදායී සේවාවක් ලබාදීමට හැකිවීම වැදගත් වේ.

අම්බලන්ගොඩ පොල්වත්ත ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව තුල ගෙවන නේවාසික අංශය ආරම්භ කර සිව්මහල් ආයුර්වේද රෝහලක් ලෙස සේවාව පුළුල් කිරීම.

- ♦ හක්මණ හා දික්වැල්ල ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල ආරම්භ කිරීම.
- ♦ ඔසු උයන් හා හරිතාගාරය සකස් කිරීම මගින් ඖෂධ නිෂ්පාදනය වර්ධනය කිරීම.
- ♦ බෙලිඅත්ත ඖෂධ නිෂ්පාදනාගාරයේ නවීකරණ කටයුතු සිදු කිරීම.
- ♦ පාරම්පරික වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය කිරීම සඳහා කටයුතු කිරීම.

♦ කරපුටුගල ආයුර්වේද රෝහලේ නේවාසික අංශය ආරම්භ කිරීම.

♦ බෙල්පාමුල්ල ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව ආරම්භ කිරීම.





♦ බෙලිඅත්ත රෝහලේ ගෙවන වාට්ටුව ආරම්භ කිරීම.

♦ වැලිපිටිය ආයුර්වේද රෝහලේ යෝග ප්‍රතිකාර ගොඩනැගිල්ල ඉදිකිරීම.

♦ විදේශිකයින් සඳහා ප්‍රතිකාර සේවාව ව්‍යාප්ත කිරීම සඳහා මිදිගම පංචකර්ම මධ්‍යස්ථානය ආරම්භ කිරිමට මූලික කටයුතු කිරීම.

## 09. ඔසු වගාව ව්‍යාප්ත කිරීම.

ඖෂධ නිෂ්පාදනාගාරයට අවශ්‍ය අමු ද්‍රව්‍ය පළාත තුළින් ලබා ගැනීම සඳහා කුරුඳුගහහැතැප්ම, කැකණදුර, රන්න යන ආයුර්වේද මධ්‍යස්ථාන තුළ හරිතාගාර ආරම්භ කිරීම මගින් ඖෂධ පැල පළාත තුළින්ම ලබා ගැනීමට කටයුතු කිරීම. ආයතන භූමි තුළ ඖෂධ වගාව ආරම්භ කර වියළි ඖෂධ ලබා ගැනීමට කටයුතු කිරීම. පාසැල් භූමි තුළ ඔසු උයන් ආරම්භ කිරීම.

| වර්ෂය | 2016 | 2017.08.31 දින දක්වා |
|---|---|---|
| ආයතන භූමි තුළ ආරම්භ කර ඇති ඔසු උයන් ගණන | 13 | 13 |
| පාසල් භූමි තුළ ආරම්භ කර ඇති ඔසු උයන් ගණන | 60 | 68 |




- "ආයු රූ සිරි" ආයුර්වේද ප්‍රදර්ශනය පැවැත්වීම.

- රෝහල් සහ මධ්‍යම බෙහෙත් ශාලා සඳහා අත්‍යාවශ්‍ය උපකරණ ලබාදීම.

- ආයුර්වේද රෝහල් සහ මධ්‍යම බෙහෙත් ශාලාවල පැවති අඩුපාඩු සම්පූර්ණ කිරීමට අලුත්වැඩියාවන් හා නවීකරණ කටයුතු ඉටු කිරීම.

- ප්‍රජා සෞඛ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- කාර්ය මණ්ඩලයේ කුසලතා වර්ධනය කිරීම සම්බන්ධව පුහුණු වැඩසටහන්.

# 2018 වර්ෂය තුළ සංවර්ධන වැඩසටහන්

මේ සඳහා පහත සඳහන් ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීම සඳහා සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

- බෙල්පාමුල්ල ආයුර්වේද රෝහල නේවාසික අංශය ආරම්භ කිරීම.
- නව ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලා 03ක් ආරම්භ කිරීම.
(බලපිටිය, කොටවිල, ලුණුගම්වෙහෙර)
- විදේශිකයින් සඳහා ප්‍රතිකාර සේවාව ව්‍යාප්ත කිරීම සඳහා පංච කර්ම මධ්‍යස්ථාන 03ක් ආරම්භ කිරීම.
- අපරැක්ක ආයුර්වේද රෝහලේ පංචකර්ම ප්‍රතිකාර ගොඩනැගිල්ල ඉදිකිරීම.
- ආයුර්වේද රෝහල් සහ මධ්‍යම බෙහෙත් ශාලාවල දැනට ශේෂ වී ඇති අඩුපාඩු සම්පූර්ණ කිරීම.
- රෝහල් සහ මධ්‍යම බෙහෙත් ශාලාවල් සඳහා අත්‍යාවශ්‍ය උපකරණ ලබාදීම.
- ඖෂධ නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය උපකරණ, යන්ත්‍ර සූත්‍ර ලබා ගැනීම සහ නිෂ්පාදනාගාරයේ නවීකරණ සිදුකිරීම හා නව තාක්ෂණය යොදාගැනීම.
- ඔසු වගාව ව්‍යාප්ත කිරීම සඳහා ඔසු උයන් හා හරිතාගාර ඇතිකිරීම.
- ප්‍රජා සෞඛ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පාරම්පරික වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය කිරීම සඳහා කටයුතු කිරීම.
- මානව සම්පත් පුහුණුව හා සංවර්ධනය.

මෙමගින් ප්‍රශස්ත සේවාවක් පළාතේ ජනතාවට ලබා දීමට කටයුතු කෙරේ.

# දකුණු පළාත්
# පළාත් පාලන දෙපාර්තමේන්තුව

## දැක්ම
## දකුණු පළාත් මහජනතාවට ප්‍රශස්ථ සේවාවක් සපයන ශක්තිමත් හා මනා පාලනයකින් යුත් පළාත් පාලන ආයතන පද්ධතියක් ඇති කිරීම





දකුණු පළාත් සභා බල ප්‍රදේශය තුළ ස්ථාපිතව ඇති මහා නගර සභා 03, නගර සභා 04 සහ ප්‍රාදේශීය සභා 42 තුළ සංවර්ධන කටයුතු සඳහා වෙන් කරනු ලබන ප්‍රතිපාදන මගින් එම කාර්යයන් ඉටු කිරීම සඳහා එම ආයතන මෙහෙයවීම, මග පෙන්වීම,උපදෙස් දීම, අධීක්ෂණ කටයුතු සිදු කිරීම හා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමත්, තාක්ෂණික සේවාවන් හා අනෙකුත් සේවාවන් ලබාදෙමින් පළාතේ මහජනතාවට ඔවුන්ගේ ජීවන තත්ත්වය වඩා යහපත් කර ගැනීමට කටයුතු කිරීම පළාත් පාලන දෙපාර්තමේන්තුවේ වගකීම වේ.

## සංවර්ධන ක්‍රියාවලිය

### ක්ෂේත්‍ර පරීක්ෂණාගාර ඉදිකිරීම

පළාත් පාලන ආයතන මගින් මාර්ග සංවර්ධනය කිරීමේ දී මාර්ගවල තත්ත්වය නිසි ප්‍රමිතිකරණයකට ලක් කිරීම තුලින් ගුණාත්මක භාවයෙන් වඩාත් උසස් නිමැවුමක් ලබාගැනීම අත්‍යවශ්‍ය කරුණකි. ඉදිකිරීම් ද්‍රව්‍ය පරීක්ෂණාගාර දෙකක් ගාල්ල හා මාතර පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයන්ට අනුබද්ධිතව ස්ථාපනය කර ඇත. මෙම පරීක්ෂණාගාර මගින් මාර්ග ඉදිකිරීම සඳහා යොදාගන්නා පස්, ගල්, වැලි, සිමෙන්ති, කොන්ක්‍රීට් වැනි අමුද්‍රව්‍ය වල ප්‍රමිතිය පරීක්ෂා කිරීම සිදුකරන අතර 2016 වර්ෂයේ දී රු. 4,769,118.45 ක අතිරික්ත ආදායමක් දකුණු පළාත් සභාව වෙත උපයා දීමට දායක වී ඇත.

### පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (පුර නැගුම)

දකුණු පළාතේ ප්‍රාදේශීය සභා 22 ක් තුළ උප ව්‍යාපෘති 28ක් ක්‍රියාත්මක කර ඇත. මේ සඳහා දරන ලද සමස්ථ පිරිවැය රු. මිලියන 1,145 කි.

## පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශ ප්‍රතිපාදන

### ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීම - 2017

දකුණු පළාතේ පළාත් පාලන ආයතන 06 ක් සඳහා රු.මි. 20.0 බැගින් ප්‍රතිපාදන අනුමත වී ඇත.
( නෙළුව, තවලම,අකුරලිය, කිරින්ද පුහුල්වැල්ල,ලුණුගම්වෙහෙර සහ හම්බන්තොට).

පළාත් පාලන ආයතන 11 ක් සඳහා රු.මි.10 බැගින් ප්‍රතිපාදන අනුමත වී ඇත.
(නියාගම, ඉමදූව, යක්කලමුල්ල, හක්මන, වැලිගම, කඹුරුපිටිය, අකුරැස්ස, මාලිම්බඩ, මුලටියන, වීරකැටිය සහ අඟුණකොලපැලැස්ස).

### මාර්ග කි.මී.1,000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන - 2017

දකුණු පළාතේ සියළුම පළාත් පාලන ආයතනය සඳහා එක් පළාත් පාලන ආයතනයකට රු.මිලියන 06 බැගින් ප්‍රතිපාදන වෙන්ව ඇත.

## මන්ත්‍රී ප්‍රතිපාදන

2017 වර්ෂයේ අගෝස්තු මස අවසන් වන විට මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්ක සඳහා රුපියල් මිලියන 14.0 ක ප්‍රතිපාදන වෙන් වී ඇති ඇත. ගාල්ල දිස්ත්‍රික්කයට කර්මාන්ත 61 ක් සඳහා රු.මි. 5.5 ක් ද මාතර දිස්ත්‍රික්කයට කර්මාන්ත 50 ක් සඳහා රු.මි. 4.7 ක් ද හම්බන්තොට දිස්ත්‍රික්කයට කර්මාන්ත 38 ක් සඳහා රු.මි. 3.8 ක කර්මාන්ත සඳහා ප්‍රතිපාදන අනුමත වී ඇති අතර එම ව්‍යාපෘති බොහොමයක් ව්‍යාපෘතිවල වැඩ අවසන් කර ඇත.

## පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (මාර්ග)

2017 වර්ෂය වෙනුවෙන් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන මාර්ග සඳහා රු.මිලියන 50.0 ක මුදලක් ද උපමාන පාදක ප්‍රදාන මාර්ග සඳහා රු.මිලියන 40.83 ක මුදලක් ද වශයෙන් දකුණු පළාතේ මාර්ග සංවර්ධනය සඳහා රු.මිලියන 90.83 ක මුදලක් අනුමත වී ඇත.

2017 වර්ෂය සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන කර්මාන්ත 13 ක් ද උපමාන පාදක සංවර්ධන ප්‍රදාන කර්මාන්ත 01 ක් නව කර්මාන්ත වශයෙන් කර්මාන්ත 14 ක් අනුමත වී ඇති අතර එම කර්මාන්තවල කටයුතු මේ වන විට සිදුකරමින් පවතී.



මොන්රොවියාවත්ත කසල ව්‍යාපෘතිය

## පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (ඝන අපද්‍රව්‍ය කළමනාකරණය)

පළාත් නිශ්චිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණය යටතේ 2017 වර්ෂය සඳහා රු.මිලියන 29 ක ප්‍රතිපාදන වෙන් වී ඇත.

මධ්‍යම පරිසර අධිකාරියේ පිළිසරු ව්‍යාපෘතියේ මූලාධාර මත රුපියල් මිලියන 80.0 ක පමණ වියදමින් රජ්ගම මොන්රෝවියාවත්ත භූමියේ කැලි කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයක් ඉදිකර ඇති අතර මෙම ව්‍යාපෘතියේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු 2012.01.20 දින සිට ආරම්භ කර ඇත. ගාල්ල දිස්ත්‍රික්කයේ ශිවිසුම්ගත පළාත් පාලන ආයතන 07 කින් සහ බූස්ස නාවික හමුදා කඳවුර, යුධ හමුදා කඳවුර යන ආයතනවලින් ගෙන එනු ලබන දිරාපත් නොවන කසල මෙ.ටො. 50.0 ක පමණ වන කසළ වලින් කාබනික පොහොර නිපදවීම මේ වන විට සිදු කරනු ලබයි. තාවකාලික බිම් පිරවුම් ව්‍යාපෘතියේ ඉදිකිරීම් අවසන් කර ඇති අතර නොදිරන අපද්‍රව්‍ය එහි තැන්පත් කිරීම සිදු කරමින් පවතී.

2017 ප්‍රජා ජල ව්‍යාපෘති, ආදාහනාගාර, සතිපොල යන ව්‍යාපෘති රු. මිලියන 64 ක වියදමින් ඉටුවෙමින් පවතී.

## පළාත් පාලන වෙනත් සේවා

මේ යටතේ 2017 වර්ෂය වෙනුවෙන් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.මිලියන 19.28 ක් හා උපමාන පාදක ප්‍රදාන යටතේ රු.මිලියන 36 ක් වෙන් වී ඇති අතර පළාත් නිශ්චිත ව්‍යාපෘති 35 ක් හා උපමාන පාදක 06 ක් ක්‍රියාත්මක වේ.



දකුණු පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ සංකල්පයකට අනුව උක්ත වැඩසටහන යටතේ 2017 වර්ෂයේ පළාත තුළ පළාතේ ආදර්ශ පෙර පාසල් 03 ක් සංවර්ධනය, ආදර්ශ ආයුර්වේද මධ්‍යස්ථාන 3 ක් සංවර්ධනය කිරීම, ආදර්ශ පුස්තකාල 3 ක් ඇති කිරීම, නොදිරන කසල වෙන්කරන ආදර්ශ ගබඩා 3 ක් ඉදිකිරීම, ආදර්ශ උද්‍යාන 3 ක් සංවර්ධනය කිරීම යන විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක වේ.

# 2018 වර්ෂය සඳහා අපේක්ෂිත සංවර්ධන වැඩසටහන්

2018 වර්ෂයේ දී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ මාර්ග 235ක් සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

නොදිරන අපද්‍රව්‍ය තැන්පත් කිරීම සඳහා මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කවල තෝරාගත් ප්‍රදේශවල පළාත් පාලන ආයතන කිහිපයක් සඳහා එක් තාවකාලික සනීපාරක්ෂක බිම් පිරවුම බැගින් ඉදිරි වර්ෂ වලදී ඉදි කිරීමට අපේක්ෂිත වේ. එක් තාවකාලික සනීපාරක්ෂක බිම් පිරවුමක් සඳහා දළ ඇස්තමේන්තුව රු.මි. 20.0 පමණ වේ.

ප්ලාස්ටික් පොලිතීන් වැනි ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය රැස්කර ගබඩා කිරීමට සුදුසු ස්ථාන දිස්ත්‍රික් මට්ටමින් පිහිටුවා ඒවා ප්‍රතිචක්‍රීකරණය කිරීමට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර ලබා දීම ඉදිරි වාර්ෂික සැලැස්ම මගින් ක්‍රියාත්මක කිරීමට නියමිත වේ.

ජනනය වන කසළ ගෘහස්ථ මට්ටමින් කළමනාකරණය කිරීමට හා කසළ ජනනය වන ස්ථානවලදීම තේරීමට ලක්කිරීම දිරිමත් කිරීම සඳහා විශේෂ ව්‍යාපෘති ඉදිරි වර්ෂයේ සැලැස්ම මගින් ක්‍රියාත්මක කිරීමට නියමිත වේ.

2018 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ පළාත් පාලන සේවා යටතේ කර්මාන්ත 25 ක් ද ජල සම්පාදන යටතේ කර්මාන්ත 33 ක් ද වශයෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වේ.

දකුණු පළාතේ පළාත් පාලන ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන සතිපොළ සංඛ්‍යාව 103 කි. එක් ආයතනයක් සතු සති පොළ සංඛ්‍යාව 1 -7 දක්වා වන අතර සති පොළක් නොමැති ආයතන ගණන 06 කි. දැනට පවතින පොදු වෙළඳ පොල සැලකිය යුතු ප්‍රමාණයක් ඉතා පැරණි හා අබලන් තත්වයේ පවතින බැවින් 2018 වර්ෂයේ දී සති පොළ 15 ක් සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

දකුණු පළාත තුල ඇති පළාත් පාලන ආයතන 49 සඳහා දැනට ඉදිකර ඇති ආදාහනගාර සංඛ්‍යාව 41කි. ආදාහනාගාර එකකට වැඩි සංඛ්‍යාවක් පවතින පළාත් පාලන ආයතන පවතින අතර, ආදාහනාගාර නොමැති පළාත් පාලන ආයතන සංඛ්‍යාව 19 කි. 2018 වර්ෂයේ දී ආදාහනාගාර 15 ක් පළාත තුල සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

තෝරාගත් නගර ආශ්‍රිතව උද්‍යාන පිහිටුවීම හා ඇවිදින මංතීරු ඉදි කිරීම නියමු ව්‍යාපෘතියක් ලෙස ඉදිරි සංවර්ධන සැලැස්ම මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

## ජාතික ඵලදායිතා තරගය - 2015

2016 වර්ෂයේ පවත්වන ලද ජාතික ඵලදායිතා තරගයේදී පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තු කාර්යාලය හා ගාල්ල හා මාතර දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාල පිළිවෙලින් දෙවන ස්ථානය හා කුසලතා සහතික ලබා ගැනිමට සමත් විය.




## පළාත් පාලන ආයතන ක්‍රීඩා උත්සවය

පළාත් පාලන ආයතනයන් අතර සහයෝගය, සුහදතාව වර්ධනය කිරීමේ අරමුණ ඇතිව පළාත් පාලන ක්‍රීඩා උත්සවය දිස්ත්‍රික්ක 03 තුළ 2016 මෙන්ම 2017 වසරේද පවත්වන ලදී.



## පළාත් පාලන ආයතන ප්‍රාථමික ශ්‍රේණීන්වල සේවකයන් සඳහා පවත්වන ලද සෞඛ්‍ය සායනය

පළාත් පාලන ආයතනයන්හි සුවිශේෂී රාජකාරි කොටසක් ආවරණය කරණු ලබන ප්‍රාථමික ශ්‍රේණීන්වල සේවය කරණු ලබන සේවක මහත්ම මහත්මීන්ගේ සෞඛ්‍ය ගැටළු සඳහා යම් සහනයක් ලබා දීමේ අරමුණින් පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව හා සම්බන්ධව ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික් පළාත් පාලන ආයතන සඳහා සෞඛ්‍ය සායන 03ක් පවත්වන ලදී.



## පළාත් පාලන සේවක ඇගයීම් වැඩසටහන

පළාත් පාලන ආයතනයන්හි කාර්ය සාධනය වර්ධනය කිරීම උදෙසා සේවක අභිප්‍රේරණය කිරීමේ අරමුණ ඇතිව 2016 වසරේදී දිස්ත්‍රික් තුනෙහි සේවකයන් 502 ක් ඇගයීමට ලක්විය. 2017 වසරේදී ද එම කටයුතු ඉටුවෙමින් පවතී.

## පළාත් පාලන සම්පත් මධ්‍යස්ථානය

ආසියා පදනමේ මූල්‍ය හා තාක්ෂණ අනුග්‍රහය සහිතව පළාත් පාලන දෙපාර්තමේන්තු කාර්යාලයේ පළාත් පාලන සම්පත් මධ්‍යස්ථානය හා දක්ෂිණ පාය අමාත්‍යාංශ සංකීර්ණයෙහි 06 වන මහල තුල පළාත් පාලන සම්පත් පුහුණු මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබන අතර, එමගින් පළාත් පාලන ආයතන උදෙසා 2016 හා 2017 වර්ෂයන් තුල දී විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ඒ යටතේ විද්‍යුත් පුරවැසි ප්‍රගති වාර්ථා ලබා ගැනීමේ වැඩසටහන්, ආදායම් කළමනාකරණ වැඩසටහන ආදිය ප්‍රමුඛ වේ.

## නව චක්‍රලේඛ සැකසීම

පළාත් පාලන ආයතනයන්හි කාර්යයන් ප්‍රශස්ථව ඉටු කිරීමට පිටුවහලක් වනු පිණිස නව චක්‍රලේඛ 9 ක් සකස් කර ඇති අතර ඒවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී.

## පුහුණු වැඩසටහන්

2016 හා 2017 වසර තුළ පළාත් පාලන ආයතනවල විවිධ අංශවල නිලධාරීන් සඳහා ජීවවායු තාක්ෂණය, ඉලෙක්ට්‍රොනික පුරවැසි ප්‍රගති වාර්තා ලබාගැනීම, අයවැයකරණය, විදුලි කාර්මික ශිල්පීන් පුහුණුව, ආකල්ප වර්ධනය, නායකත්ව වර්ධනය, තොරතුරු දැන ගැනීමේ පනත, කසල කළමනාකරණ පද්ධති යාවත් කාලීන කිරීම, ලිපිගොනු කළමනාකරණය වැනි ක්ෂේත්‍ර අලලා පුහුණු වැඩසටහන් 20 ක් ක්‍රියාත්මක කරන ලදී.





# දකුණු පළාත්
# මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

## දැක්ම
## ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම මගී ප්‍රවාහන සේවා පහසුකම් සපයන්නා වීම





දකුණු පළාතේ මගී ප්‍රවාහන නියාමන ආයතනය වශයෙන් රාජ්‍ය හා පෞද්ගලික ධාවකයින්ගේ දායකත්වය මත ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව රට තුල ක්‍රියාත්මක සංවර්ධන ක්‍රියාවලියට ගැලපෙන අයුරින්, සම්පූර්ණයෙන් ඒකාබද්ධ හා නියාමනය වු ප්‍රවාහන ජාලයක් ගොඩනැගීම සඳහා සැලසුම් කිරීම, එම සැලසුම් ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා පාලනය කිරීම මෙම අධිකාරියට පැවරී ඇත.

මේ යටතේ 2017 වසර තුලද දකුණු පළාතේ මාර්ග 532 යටතේ දෛනිකව ගමන්වාර 14438 ක් ක්‍රියාත්මක කිරීමත් දකුණු පළාතේ ක්‍රියාත්මක බස්නැවතුම්පොල 42 යටතේ පොදු පහසුකම් ප්‍රවාහන සැපයීමත් ශ්‍රීලංගම හා පෞද්ගලික අංශයේ ධාවකයින් පොදු ප්‍රවාහන ප්‍රතිපත්තින්ට අනුව දෛනිකව නියාමනය කිරීමත්, සමස්ථ මගී ජනතාවට බලපාන පොදු පහසුකම් ගොඩනගමින් අඛණ්ඩව සංවර්ධනයක් පවත්වාගෙන යාම සඳහා දායකත්වය ලබාදීමත් මගී ඉල්ලුම පදනම්ව නැවත ප්‍රවාහන සේවා සැලසුම් කිරීම, ජනිතවන අසීමිත ප්‍රවාහන ගැටළු සම්බන්ධයෙන් තාක්ෂණික ක්‍රම උපායන් යටතේ විසඳුම් ජනිත කිරීමත් හා පිරිවැය පරිපාලනය කිරීම සඳහා බලශක්ති සංරක්ෂණ ව්‍යාපෘති කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ආයතනයේ ඵලදායිතාවයට නැඹුරුව ජාත්‍යන්තර තත්ත්වකරණ ප්‍රමිතීන්ට අනුව ප්‍රවාහනයේ ගුණාත්මකභාවය සංවර්ධනය කිරීම සඳහා වැඩසටහන් මෙහෙයවීම අධිකාරි විසින් සිදුකරමින් පවතී.

# ප්‍රවාහන ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් සංවර්ධනය



කඹුරුපිටිය බස් නැවතුම්පල

ප්‍රධාන වශයෙන් නවීන තාක්ෂණික පහසුකම් ලබාදෙමින් නව බස් නැවතුම්පොලවල් ඉදිකිරීම හා නවීකරණය කිරීම, බස් නැවතුම්පොල අංගන වාර්ෂිකව අලුත්වැඩියා කිරීම, මගී ජනතාවට අවශ්‍ය මගී ආවරණ ඉදිකිරීම හා නඩත්තු කිරීම, වැසිකිළි පහසුකම් ඇතුළු සනීපාරක්ෂණ පහසුකම් වර්ධනය කිරීම මූලිකව මේ යටතේ සිදු කෙරේ. ඒ අනුව 2017 වර්ෂය තුල රුපියල් මිලියන 49.17 දකුණු පළාත සඳහා වැයකරමින් හික්කඩුව බස් නැවතුම්පොල ඉදි කිරීම, තිස්සමහාරාම, කඹුරුපිටිය බස් නැවතුම්පොල යටතේ විධිමත් හා අංග සම්පූර්ණ වැසිකිලි පද්ධති ඉදි කිරීමත් පළාත පුරා මගී ආවරණ රුපියල් මිලියන 2.0 ක් යටතේ ඉදිකිරීමත් සේවා විධිමත්ව පවත්වාගෙන යාම සඳහා බස්රථ අධීක්ෂණ පද්ධතිය යටතේ CCTV කැමරා 75 ක් පළාත පුරා ස්ථාපිත කිරීමත්, තොරතුරු සන්නිවේදනය සඳහා දැනට ස්ථාපිත කාලසටහන් පුළුල් තිර ප්‍රමාණය වැඩිකරමින් තවත් 07 ක් තවදුරටත් ස්ථාපිත කිරීම, සේවාවේ ගුණාත්මකභාවය සඳහා කොන්දොස්තර මහතුන් හා රියදුරු මහතුන් 1160 ක් පුහුණු කිරීමත් සිදු කර ඇති අතර, මගී ප්‍රවාහනයේ යෙදෙන සේවකයින්ගේ සුභසාධනය සඳහා රුපියල් මිලියන 3.0 ක වියදමින් ඔවුන්ගේ දුවා දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා පහසුකම් සැපයීමත් සිදුකර ඇත.

මීට සමගාමීව බස් නැවතුම්පොල බලශක්ති සංරක්ෂණය හා උත්පාදනය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් බස් නැවතුම්පොල තුල සූර්ය පැනල සවි කිරීම් යටතේ ගාල්ල, ඇල්පිටිය, තිස්සමහාරාමය යන බස් නැවතුම්පොලවල් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 5.8 ක් වැයකර ඇති අතර පුරනැගුම ව්‍යාපෘතිය යටතේ කඹුරුපිටිය හා ලුණුගම්වෙහෙර බස් නැවතුම්පොලවල් ඉදිකර අවසන් කිරීමට 2017 වර්ෂයේදී හැකිවී ඇත. මේ අනුව 2017 වර්ෂය තුලදී දකුණු පළාතේ ප්‍රවාහන සංවර්ධනය සඳහා ප්‍රමුඛ කාර්යභාර්යක් දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය හරහා සිදු කිරීමට හැකියාව ලැබී ඇති බව පැහැදිලිවේ.

# 2018 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති



## ප්‍රවාහන ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

දකුණු පළාත තුල තවදුරටත් ඉදි කිරීමට ඉතිරිව ඇති අකුරැස්ස බස් නැවතුම්පොල විශේෂ ව්‍යාපෘති ප්‍රතිපාදන යටතේ රුපියල් මිලියන 81.0 ක වියදමින් ඉදිකිරීමට අපේක්ෂිතය.

මීට අමතරව තවලම, සූරියවැව, වලස්මුල්ල, යක්කලමුල්ල, හම්බන්තොට බස් නැවතුම්පලවල් සංවර්ධනය කිරීමට අපේක්ෂිතය. එමෙන්ම හක්මන, අම්බලන්තොට, මාපලගම, අවිත්තාව බස් නැවතුම්පල වල සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම සිදුවේ.

## ප්‍රවාහන තොරතුරු සඳහා තාක්ෂණික පහසුකම් පුළුල් කිරීම.

බස්රථ අධීක්ෂණ කැමරා පද්ධතිය තවදුරටත් ව්‍යාප්ත කිරීම.
නවීන තාක්ෂණික පහසුකම් තවදුරටත් සංවර්ධනය කරමින් 2018 වර්ෂය තුලදී දැනට දකුණු පළාත තුල සම්පූර්ණයෙන් සවිකර ඇති කැමරා 184 ට අතිරේකව තවත් රුපිලයල් මිලියන 04 ක් වැයකරමින් කැමරා 75 ක් සවිකිරීමට සැලසුම් කර ඇත. ඒ යටතේ දැනට කැමරා සවිකර නැති ලුණුගම්වෙහෙර, වලස්මුල්ල හා දෙනියාය බස් නැවතුම්පොල යටතේත් මාර්ග ආවරණය වන පරිදි කැමරා 30 ක් පමණ සවිකරමින් දකුණු පළාත ආවරණය වන පරිදි පද්ධතිය සම්පූර්ණ කිරීමටත් අපේක්ෂා කෙරේ.



දූ දරුවන් සඳහා පාසල් උපකරණ ලබාදීම

## සේවක සුභසාධනය

ප්‍රවාහන ක්ෂේත්‍රයේ නියුතු සේවකයින් සඳහා සුභසාධන වැඩසටහන් රාජ්‍ය අංශය යටතේ ක්‍රියාත්මක නොවීමේ අඩුපාඩුව සම්පූර්ණ කරමින් ක්ෂේත්‍රයේ නියුතු වුවන්ගේ දරුවන්ගේ අධ්‍යාපන ජයග්‍රහණ අගයමින් ඔවුන් දිරිගැන්විම සඳහා සිසුණැන ශිෂ්‍යත්ව වැඩසටහන තුලින් පළාතේ දරුවන් 1500 කට පාසල් උපකරණ ලබාදීමට අපේක්ෂිතවේ. ඒ තුලින් සේවක මහතුන් හා නියාමන ආයතනය අතර ගොඩනැගෙන සම්බන්ධතාවය තුලින් ගුණාත්මක බව වර්ධනය සඳහා අවස්ථාවක් උදාකර ගැනීම මෙහි ඇති විශාලම වටිනාකමවේ. මේ සඳහා 2018 වසර තුල වෙන් කිරීමට අපේක්ෂිත මුදල මිලියන 3.2 ක් වේ.

## සේවක නිල ඇඳුම් නොමිලයේ ලබාදීම හා විශේෂ පුහුණු වැඩසටහන්

පොදු ප්‍රවාහන සේවාන් හි සේවය කරනු ලබන සේවකයින් නිශ්චිත නිල ඇඳුමකින් තොරව අවිධිමත් ආකාරයෙන් කටයුතු කිරිම තුලින් සේවාව තුල පවතින ගැටළු සඳහා පිළියමක් ලෙසත්, ගුණාත්මක බව වර්ධනය කිරීම සඳහාත් මෙම ව්‍යාපෘතිය දකුණු පළාත තුල ආරම්භ කර ඇත. මේ යටතේ රුපියල් ලක්ෂ 30 ක වියදමින් දකුණු පළාතේ මගී ප්‍රවාහන සේවාවේ නියුක්ත රියදුරු/කොන්දොස්තර මහතුන් සඳහා නොමිලයේ වසරකට එක නිල ඇඳුම බැගින් ලබාදෙමින් හා සේවක විනය හා ආකල්ප වර්ධනය සඳහා කොන්දොස්තර මහතුන්ට නොමිලයේ සංස්කරණ පුහුණු වැඩසටහන් ආරම්භ කර පවත්වාගෙන යාමත් සිදු කෙරේ.



රියදුරු බලපත්‍ර සඳහා පුහුණුව ලබාදීම

## ධාවන කාලය අඩුකිරීම මගින් ප්‍රවාහන සේවා විධිමත් කිරීම.

2017 අග වන වන විට මාර්ග 65 ක බස්රථ වල ධාවනය කාලය රටේ මාර්ග සංවර්ධනයට සාපේක්ෂව සංශෝධනය කර ඇති අතර 2018 වසර තුල තවත් මාර්ග 10 ක ධාවන කාලය විද්‍යාත්මකව නැවත ගැලපීමට සැලසුම් කර ඇත. මෙය ඉතා සංකීර්ණ හා බැරෑරුම් කාර්යයක් වන අතර සමීක්ෂණ හා අඛණ්ඩ සැලසුම් සකස් කරමින් සාකච්ඡා කිරීම තුලින් සිදුකල යුතු අතර, දැනට ධාවන කාලය අඩුකර ඇති මාර්ග යටතේ දිනකට ඉතුරුවන මිනිස් පැය සංඛ්‍යාව 35000 ක අධික වන අතර එය විශාල කර්මාන්ත ශාලා 30 කට වැඩි ශ්‍රම දායකත්වයට සමානවේ.

## සිසුසැරිය ව්‍යාපෘතිය යටතේ පාසල් ළමුන්ට ප්‍රවාහන පහසුකම් සංවර්ධනය

මධ්‍යම රජයේ සහනාධාර යටතේ ක්‍රියාත්මක වන සිසුසැරිය යටතේ පාසල් සේවා ආරම්භ කිරීමේ වැඩපිළිවෙල තවත් පුළුල් කරමින් දැනට පවතින සේවාවන්ට අතිරේකව තවත් පාසල් සේවා බස්රථ 10 ක් 2018 වසර තුල ආරම්භ කිරීමට සැලසුම් කර ඇති අතර, ඒ තුලින් දකුණු පළාතේ පාසැල් ළමුන්ට තවතවත් සහන හා පහසුකම් වර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

## සේවක පුහුණුව ප්‍රමාණාත්මකව වර්ධනය කිරීම.

කාලීන ප්‍රවාහන ගැටළු හා අභියෝගයන්ට අනුව සංකීර්ණ සේවාවක යෙදී ඇති රියදුරු කොන්දොස්තර මහතුන් වාර්ෂිකව පුහුණු කිරීමේ අවශ්‍යතාවය හා රියදුරු මහතුන්ට 2018 වසරේ සිට මගී ප්‍රවාහන කටයුතු වල යෙදීම සඳහා මෝටර් රථ කොමසාරිස් කාර්යාලය යටතේ මගී ප්‍රවාහන අනුමත බලපත්‍රය ගත යුතු අතර, එය අධිකාරිය යටතේ ක්‍රියාත්මක කරමින් දැනට 1324 ක් වන බලපත්‍ර යටතේ ලියාපදිංචි රියදුරන් සියලූ දෙනත් අතිරේකව සේවය කරනු ලබන රියදුරන් සියලූ දෙනාත් 2018 පළමු කාර්තුව අවසන්වන විට විධිමත්ව පුහුණු කොට බලපත්‍ර ලබාදීමට සැලසුම් සකස් කර ඇති අතර ඒ සඳහා 2018 වසර තුල රු.මිලියන 1.5 ක් වැය කිරීමට අපේක්ෂා කෙරේ.




## නව මගී ආවරණ ඉදිකිරීම හා පවතින මගී ආවරණ ජනතාවට පරිහරණය කළ හැකි මට්ටමට සංවර්ධනය කිරීම.

දැනට දකුණු පළාත තුල ඇති මගී ආවරණ අධිකාරිය යටතේ මෙන්ම පෞද්ගලික අංශය යටතේ ඉදිකර ඇතත්,තවදුරටත් සේවා අවශ්‍යතා පවතින ස්ථාන ආවරණය වන පරිදි මගී ආවරණ 30 ක් රු.මිලියන 8 ක වියදමින් 2018 වසර තුල ඉදි කිරීමට අපේක්ෂා කෙරේ. එසේම දැනට පවතින මගී ආවරණ පරිහරණය කල හැකි මට්ටමට නැවත සංවර්ධනය කොට පිරිසිදු කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2018 වසර තුල මගී ආවරණ 50 ක් ප්‍රතිසංස්කරණය කිරීමට අපේක්ෂිත අතර ඒ සඳහා 2018 වසර තුල රු.මිලියන 1.5 ක් වැය කිරීමට අපේක්ෂා කෙරේ.

## අධිකාරියේ පරිගණක පද්ධතිය වර්තමානයට ගැලපෙන පරිදි සංවර්ධනය

ප්‍රවාහන ජාලය හා සම්බන්ධ වන තොරතුරු පද්ධති වර්තමානයට ගැලපෙන පරිදි සංවර්ධනය කිරීම සඳහා මෙම පද්ධතිය යාවත්කාලීන කිරීම මේ වන විට ආරම්භ කර ඇති අතර එය 2018 වසර තුල අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. මෙ ව්‍යාපෘතිය අවසන් වීමත් සමග බස් ධාවන ලොග් පත්‍ර ලබා ගැනීම හා මුදල් ගෙවීම නිවසේ සිට සිදු කිරීමට පහසුකම් ජනිත කිරීමටත් බලපත්‍ර පිලිබඳ විස්තර හා පැමිණිලි පිලිබඳ තොරතුරු SMS පණිවුඩ මගින් ලබාදීමටත් සැලසුම් කර ඇත. මේ සඳහා 2018 වසර තුල රු. මිලියන 2.7 වැය කිරීමට අපේක්ෂා කෙරේ.

## විශාල විදුලි බිලක් යොමුවන බස්නැවතුම්පොල ආවරණය වන පරිදි සූර්ය පැනල සවිකිරීම.

රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව යමින් සෑම රාජ්‍ය ආයතනයක්ම සූර්ය බලශක්තිය යටතේ ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිපත්තියට මුල් තැන දෙමින් මේ සඳහා විශාල විභවතාවයක් පවතින බස් නැවතුම්පොල මහලය භාවිතා කොට බලශක්තිය උත්පාදනය කිරීමටත් ඒ යටතේ විශාල විදුලි බිලක් ජනනය වන බස් නැවතුම්පොල පිරිවැය අඩු කිරීමටත් පරිසර හිතකාමි ව්‍යාපෘතියක් ලෙස විශාල ඉඩ ප්‍රමාණයක් පවතින බස් නැවතුම්පොල වහලවල් ඵලදායි කාර්යයක් සඳහා භාවිතා කිරීමත් මේ තුලින් අපේක්ෂා කරන අතර මෙම ව්‍යාපෘතිය 2018 වසර තුල ඌරගහ, පිටිගල, හබරාදුව, වීරකැටිය, සූරියවැව බස් නවැතුම්පොල දක්වා ව්‍යාප්ත කිරීමටත් අපේක්ෂා කරන අතර ඒ සඳහා රු. මිලියන 6 ක් වැය කිරීමට අපේක්ෂා කෙරේ.

## මඟී පහසුකම් සංවර්ධනය කරමින් දුර සේවා ආසන වෙන් කිරීමේ තාක්ෂණික ක්‍රමවේදයක් හඳුන්වාදීම.

දියුණු රාජ්‍යයන්හි අනුගමනය කරනු ලබන මෙම ක්‍රමවේදය 2018 වසර තුල දකුණු පළාත තුල ආරම්භ කිරීමට සැලසුම් කර ඇති අතර මේ තුලින් මගීන්ට නිකරුනේ කාලය නාස්ති කරමින් හා විශාල වේලාවන් රැඳී සිටිමින් ප්‍රවාහන පහසුකම් ලබා ගැනීම වෙනුවට ආසන වෙන් කිරීමේ ක්‍රමයක් හඳුන්වාදී නියමිත වේලාවට ප්‍රවාහන පහසුකම් සපයා ගැනීමට යොමු වීමේ හැකියාව ගොඩ නැඟීමට අපේක්ෂා කෙරේ. සංචාරක පුරවරයක් ලෙස මෙය පළාතට විශේෂ වාසියක් ගෙන දෙන ව්‍යාපෘතියක් ලෙස පරිගණක වැඩසටහන් සැකසීම සේවකයින් පුහුණු කිරීම හා අවශ්‍ය උපාංග ලබා ගැනීමට 2018 වසර තුල රු. මිලියන 02 ක් වෙන් කිරීමට අපේක්ෂා කෙරේ.

## බස් නැවතුම්පොල ආශ්‍රිතව රථවාහන ගාල් ස්ථාපිත කිරීම.

පොදු ප්‍රවාහන සේවා සංවර්ධනය කිරීම සඳහා අත්‍යවශ්‍ය අංගයක් ලෙස අත්‍යවශ්‍ය වන විධිමත් රථගාල් ඇති කිරීම සඳහා ප්‍රවාහන අධිකාරියේ අවධානය යොමු වී ඇති අතර බස්නැවතුම්පොල ආශ්‍රිතව පවතින අතිරේක ඉඩ මේ සඳහා භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ. මෙය කාලීන අවශ්‍යතාවයක් ලෙස මෙම ව්‍යාපෘතිය සඳහා 2018 වසර තුල රු. මිලියන 3 ක් වෙන් කිරීමට අපේක්ෂා කෙරේ.

## බස් නැවතුම්පොල භූමියෙහි පවතින අතිරේක ස්ථාන ඵලදායි කාර්යයන් සඳහා භාවිතා කිරීම.

දකුණු පළාත තුල පවතින බස් නැවතුම්පොල 42 න් බොහෝමයක් බස් නැවතුම්පොලවල අතිරේක ඉඩ ප්‍රමාණයන් පවතින අතර එම සම්පත් මේ වන තෙක් භාවිතයට ගෙන නැත. එම ස්ථාන බොහෝ විට පෞද්ගලික අංශය විසින් අල්ලා ගැනීමට ප්‍රයත්න දරන අතර ඒ සඳහා ක්‍රියාකිරීමට විශාල නඩු ප්‍රමාණයක් ගොනු කිරීමට සිදුවී ඇත. එම තත්ත්වය තුල දේපල ආරක්ෂා කර ගැනීම සඳහාත් අනවශ්‍ය ගැටුම් හා නීති කටයුතුවලට යන විශාල පිරිවැය අවම කොට එම ස්ථාන ව්‍යාපාරික වශයෙන් සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන අතර ඒ යටතේ උඩුගම, ඌරගහ, ඇල්පිටිය, සූරියවැව, තිස්සමහාරාම යන බස් නැවතුම්පොල අතිරේක භූමිය පළමු අදියර යටතේ භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ. ඒ සඳහා 2018 වසර තුල රු.මිලියන 6 ක් වෙන් කිරීමට අපේක්ෂා කෙරේ.

# දකුණු පළාත්
# රුහුණු සංචාරක කාර්යාංශය

## දැක්ම
## දකුණු පළාත සංචාරක ගමනාන්තයක් වශයෙන් ජනප්‍රිය කරවීම





රටක විදේශ විනිමය උත්පාදනය කිරීමේ ප්‍රමුඛ මාර්ගයක් වශයෙන් සංචාරක ක්ෂේත්‍රය හැඳින්විය හැකිය. සොබා සෞන්දර්යය මෙන්ම පෞරාණික සංස්කෘතික වටිනාකම් වලින් පොහොසත් රටක් වශයෙන් ශ්‍රී ලංකාවද සංචාරක ක්ෂේත්‍රය කෙරෙහි විශේෂ අවධානයක් යොමුකොට ඇත. ලොව පුරා සංචාරක ආකර්ෂණය ශ්‍රී ලංකාව වෙත ඇද බැද ගැන්ම සඳහා රටක් වශයෙන් දරණ උත්සාහයට අත්වැලක් සපයමින් දකුණු පළාත තුල සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමෙහිලා කටයුතු කරන එකම රාජ්‍ය ආයතනය වශයෙන් රුහුණු සංචාරක කාර්යංශය හඳුන්වා දිය හැකිය.

සංචාරක ව්‍යාපාරයට අදාල ජාතික සැලසුම් හා ප්‍රතිපත්ති වලට අනුකූලවන පරිදි දකුණු පළාතේ සංචාරක කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම රුහුණු සංචාරක කාර්යංශයේ ප්‍රධාන පරමාර්ථය වේ.මෙහිදි විශේෂයෙන්ම දේශීය සංචාරක කටයුතු නගාසිටුවීම හා විදේශීය සංචාරක කටයුතු පිළිබඳ ප්‍රවර්ධනය කිරීම යන අංශ දෙක කෙරෙහි අවධානය යොමුකෙරේ. මේ යටතේ දකුණු පළාතේ සංචාරක සේවා දිරිගැන්වීම, නව සංචාරක ස්ථාන හදුනා ගැනීම ,ප්‍රවර්ධනය කිරීම හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය, ක්ෂේත්‍රය හා සම්බන්ධ මානව සම්පත් සංවර්ධනය , සංචාරක සේවා සපයන ආයතන හා සංචාරක සේවාවන්ට සම්බන්ධ සංවිධාන හා හවුල්කාර පුද්ගලයින්ට අවශ්‍ය උපකාර කිරීම සිදුකෙරේ. 2016 හා 2017 වර්ෂවල රු.මි 140 කට ආසන්න ප්‍රතිපාදන යොදවා දකුණු පළාතේ සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම උදෙසා රුහුණු සංචාරක කාර්යංශය විසින් ව්‍යාපෘති ක්‍රියාවට නංවා ඇත.

විශේෂයෙන් දකුණු පළාතට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ට ගුණාත්මක සේවාවක් ලබාදීම සඳහා සංචාරක මාර්ගෝපදේශකයින් පුහුණු කිරීම වාර්ෂිකව සිදුකරනු ලබන අතර 2016 වර්ෂයේදී මාර්ගෝපදේශකයන් 37 ක් පුහුණු කර බලපත්‍ර ලබාදී ඇත. නිවැරදි තොරතුරු ලබාදීම හා සංචාරකයින්හට සිදුවන හිරිහැර අවම කිරීම අරමුණු කොට සිදුවන සංචාරක මාර්ගෝපදේශක පුහුණුව නිසා රැකියා ප්‍රශ්නයට විසඳුමක් සේම දකුණු පළාතට පිවිසෙන සංචාරකයින් සඳහා ගුණාත්මක සේවාවක් ලබාගැනීමේ අවස්ථාවද උදාකර ඇති බව සතුටින් ප්‍රකාශකර සිටිමු.



කොට්ටව සංචාරක ආකර්ෂණීය ස්ථාන සංවර්ධනය

මඩොල්දූව
වැසිකිලි පද්ධතිය
ඉදිකිරීම





කන්නෙලිය ප්‍රජා සංචාරක ගම්මාන ව්‍යාපෘතිය හා ග්‍රාමීය අලෙවිසල ඉදිකිරීම



බිසෝදොල ඇල්ල ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය
(ප්‍රවේශ මාර්ගය හා රථගාල සකස් කිරීම)



මාදම්පාවිල ෆ්ලෝටීන් ජැටිය



සත්මහල් ඇල්ල ප්‍රවේශ මාර්ගය ඉන්ටර්ලොක් අතුරා සකස් කිරීම



අකුරල වෙරළ ආශ්‍රිතව ජංගම පොදු පහසුකම් සැපයීමේ
මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම



දේණුවල පංචකර්ම මධ්‍යස්ථානය ඉදිකිරීම




කෘෂි පාරිසරික ගම්මානයක් වශයෙන් සංවර්ධනය වන මදුනාගල සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය ආශ්‍රිතව සකස්කළ ප්‍රධාන සැලැස්ම යටතේ හඳුනාගත් ව්‍යාපෘති කිහිපයක් 2016 හා 2017 වර්ෂයන්හිද ක්‍රියාවට නංවා ඇත. 2016 වර්ෂයේ ඉදිකිරීම් අවසන්වූ මදුනාගල නව සංචාරක බංගලාව 2017.03.30 දින සංචාරකයින් සඳහා විවෘත කරන ලද අතර මේ වන විට ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් ලෙස සාර්ථකව ක්‍රියාත්මක වේ. ඊට අමතරව ප්‍රදේශයේ හඳුනාගත් අවශ්‍යතාවයක් වන පිරිසිදු ආහාර වේලක් ලබාගැනීමේ ස්ථානයක් නොවීමට පිළියමක් වශයෙන් 2017 වර්ෂයේ භෝජනාගාරයක් ඉදිකිරීම සඳහා රු. මි.14 ක මුදලක් වෙන්කොට ඇත. එසේම දැනට පවතින දෙමහල් නිවස ආශ්‍රිතව නවාතැන් පහසුකම් පුළුල් කිරීම සඳහා රු.මි 5 ක මුදලක් වැයකිරිමට අපේක්ෂිත වේ. එසේම දැනට ක්‍රියාත්මක සංචාරක නිවාස ආශ්‍රිතව ඇල්දිය නාන තටාකය ඉදිකිරීම සඳහා සැලසුම් සකස්කර ඇත.

මෙයට අමතරව සංචාරක ක්ෂේත්‍රයට අදාල මානව සම්පත සංවර්ධනය කිරීමේ අරමුණින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක වේ.

# සංචාරක මාර්ගෝපදේශන වැඩසටහන



සංචාරක මාර්ගෝපදේශකයන් 59 ක් සඳහා
සති 02 ක පන්ති කාමර පුහුණුවක් හා
දෙදින ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවක් සංවිධානය කරන ලදී.



## තෛමාසික හෝටල් පුහුණු පාඨමාලාව

සිසුන් 41 දෙනෙකු සඳහා පුහුණු පාඨමාලා 2 ක් අවසන් කර ඇත.



## හෝටල් හිමියන් සහ සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධිත පුරවැසියන් දැනුවත් කිරීම

# දකුණු පළාත් සංවර්ධන අධිකාරිය

## දැක්ම

**තිරසාර ආර්ථික හා සමාජ සංවර්ධනයේ තෘප්තිකර ප්‍රතිලාභ භුක්ති විදින ජාතික උරුමයෙන් පෝෂිත දක්ෂිණ දේශිකයන්ගේ සමාජයක්**





දකුණු පළාතේ ආර්ථික හා සමාජ සංවර්ධනයට අදාළ සංවර්ධන ක්‍රියාකාරකම් ඉටු කිරිම අරමුණු කොටගත් ආයතනයක් වන දකුණු පළාත් සංවර්ධන අධිකාරිය විසින් කෘෂිකාර්මික, කාර්මික හා සේවා යන ආර්ථිකයේ ප්‍රධාන අංශ තුනටම අදාළ වු වැඩසටහන් හා ව්‍යාපෘති නිර්මාණය කොට ක්‍රියාත්මක කරනු ලබයි.

ඉහත අංශවලට අදාළව සේවා සපයන දකුණු පළාතේ සෙසු රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි පවතින නෛතික රාමුව තුළ ක්‍රියාත්මක කළ නොහැකි හා ඌනතා පවතින අංශ හඳුනාගෙන ඒවායේ නිෂ්පාදනය හා ඵලදායීතාවය ඉහළ නැංවීමට යෝග්‍ය වැඩසටහන් හා ව්‍යාපෘති නිර්මාණය කොට ක්‍රියාත්මක කිරිම මෙම ආයතනයේ මුලික පරමාර්ථය වේ.

ඒ අනුව 2017 වර්ෂයේආරම්භය පහත තේමාවන් යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමට කටයුතු කර ඇති අතර බොහෝමයක් ව්‍යාපෘති මෙතෙක් අවිච්ඡින්නව ක්‍රියාත්මක කළ ව්‍යාපෘතින්ට අමතරව 2017 වර්ෂයේ සිට ආයතනික මූල්‍ය ස්වාධීනත්වය ඉලක්ක කර ආරම්භ කරන ලද නවක ව්‍යාපෘතියක් වේ.

# මී මැසි පාලන ව්‍යාපෘති ප්‍රවර්ධනයට සහය ලබාදීම





ගාල්ල,මාතර, හම්බන්තොට දිස්ත්‍රික්ක තුනම කණ්ඩායම් 03ක් තෝරා ගෙන සමිති පිහිටුවා මූලික දැනුවත් කිරිමේ වැඩ සටහන් පැවැත්වීම.

දිස්ත්‍රික්ක තුනෙහි තෝරාගත් සාමාජිකයින් ප්‍රායෝගික හා න්‍යායාත්මක පුහුණුව ලබාදී ඇත. උපකරණ ලබාදීමේ කටයුතු ඉටුවෙමින් පවතී.

# භාවිතයට නොගත් මඩ ඉඩම් සංවර්ධනය

දකුණු පළාතේ භූමි ඵලදායීතාව ඉහළ නංවාලීමේ අරමුණින් දශක ගණනාවක් පුරන්ව පැවති කුඹුරු අස්වැද්දීමට ප්‍රමුඛත්වය දෙමින් කාබනික යෙදවුම් මගින් දේශීය පාරම්පරික වී ප්‍රභේද වගා කිරිමේ ව්‍යාපෘතිය කෙතක මහිම ක්‍රියාත්මක වේ.

2016 වසර තුළ බිත්තර වී කිලෝ 1430 ක් ගොවීන්ට ලබා දී ඇත.

කෙතක මහිම ව්‍යාපෘතිය තුළින් ඍජුව හා වක්‍රව දකුණු පළාතේ ගොවීන් රාශියක් ප්‍රතිලාභ ලබන අතර මේ වන විට තිලකපුර ලිවිස්ටන් වත්ත ජනපදයට මායිම්ව පිහිටි ඇල මාර්ගය ප්‍රතිසංස්කරණ කර ඇත.

# විසිතුරු මත්ස්‍ය වගාව





දකුණේ ප්‍රධානතම විසිතුරු මත්ස්‍ය අපනයනකරු බිහිකිරීමේ අරමුණින් පිහිටුවන ලද 15 දෙනෙකුගෙන් යුතු ප්‍රධානතම විසිතුරු මත්ස්‍ය වගාකරුවන්ගේ සමිතිය දැනට පිහිටුවා ඇති අතර විසිතුරු මත්ස්‍ය වගාව දියුණු කිරීමේ අපේක්ෂාවෙන් පොලී රහිත ණය මුදල් ලබා දී ඔවුන්ට සානුබල සපයා ඇත.

# රියදුරු පුහුණුව සඳහා අනුයුක්ත කිරිම

2016 වර්ෂයේදී රියදුරු පුහුණුව සඳහා 28 දෙනෙක් අනුයුක්ත කර ඇත. 2017 වසර සඳහා 6 දෙනෙකු රියදුරු පුහුණුව සඳහා අනුයුක්ත කර ඇත.

# කැපූ මල්, විසිතුරු පැළ සහ උද්‍යාන අලංකරණ ව්‍යාපෘතිය



මේ සඳහා ව්‍යාපෘති වාර්තා සකස් කර ඇති අතර පේරාදෙණිය මල්වගා පර්යේෂණ ආයතනයේ ද මග පෙන්වීම යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. මේ වන විට මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන රාජ්‍ය නිලධාරීන් හා මල් වගා කරුවන් හඳුනා ගෙන ඇත.

2017 වසරේදී මල් වගා වෙළඳ ප්‍රදර්ශනය ගාල්ල නගර සභා ක්‍රීඩාංගනයේදී පවත්වන ලදී.

# කොග්ගල හෝටල් පාසලේ පුහුණු පාඨමාලා පැවැත්වීම

පුහුණු පාසලේ විදුහල්පතිතුමාගේ සහය හා මගපෙන්වීම යටතේ පුහුණුලාභින් බඳවාගැනිම සඳහා දැනුවත් කිරිමේ වැඩසටහන් ක්‍රියාත්මක කර අතර 2016 වර්ෂයේදී ප්‍රතිලාභින් 28 දෙනෙකු සඳහා අවශ්‍ය මුල්‍ය ආධාර හා උපකරණ කට්ටල ලබාදීම සිදුකර ඇත. 2017 වසර සඳහා ප්‍රතිලාභින් 2 දෙනෙකු සඳහා අවශ්‍ය මුල්‍ය ආධාර ලබාදීම සිදුකර ඇත.

# දහම් දිරිය ව්‍යාපෘතිය



ස්වේච්ඡාවෙන් තම වටිනා කාලය කැප කරමින් දුවා දරුවන්ට දහම් අධ්‍යාපනය ලබා දෙමින් ඉමහත් සේවාවක් සමාජයට ඉටුකරන දකුණේ දහම් ගුරුභවතුන් වෙනුවෙන් දහම් ගුරුමග අත්පොත නිර්මාණය කරන ලදි.

# යොවුන් සවිය

මෙම ව්‍යාපෘතිය යටතේ තරුණ තරුණියන්ගේ ආකල්ප හා හැකියා සංවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් 2016 වසර තුල දෙදින නායකත්ව පුහුණු කඳවුරක් පැවැත්වූ අතර මේ වසර තුලද තරුණ තරුණියන්ගේ හැකියාවන වර්ධනය කිරීම උදෙසා විවිධ ක්ෂේත්‍රයන් තුල තෝරාගනු ලැබූ තරුණ තරුණියන් පුහුණු කිරීමට යෝජනා වී ඇති අතර මේ වන විටත් එහි මූලික කටයුතු සිදු වෙමින් පවතී.

# ජීව වායු ඒකක ඉදි කිරීම











**BIO GAS**
**WAKWELLA**

2015 වසරේ සිට රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ජීව වායු ඒකක 7 ක් ඉදිකර ඇත. පුනර්ජනනීය බලශක්ති ප්‍රවර්ධනය සඳහා පුහුණු කරුවන් පුහුණු කිරිම(TOT) පුහුණු වැඩ සටහන්, නියෝජ්‍ය ප්‍රධාන,ලේකම් (ඉංජිනේරු සේවා) ආයතනය හා පීපල් ඉන් නීඩ්ස් ආයතනය සම්බන්ධ කර ගනිමින් 2016 මැයි මාසයේදී පවත්වන ලදී. මෙහි දෙවන පියවර වශයෙන් ජීව වායු ඒකක ඉදි කිරීම සම්බන්ධයෙන් ප්‍රායෝගික පුහුණුවක් 2016 ජුලි මාසයේදී ධනුද්දර උත්සව ශාලාවේ ඉදි කළ ජීව වායු ඒකකය පදනම් කර ගෙන සිදු කරන ලදී.

# කර්මාන්තපුරය

උඩුකාව පිහිටි කර්මාන්ත පුරයේ වසර කිහිපයක සිට අක්‍රීයව පැවති කර්මාන්ත ඉවත් කර නව ආයෝජකයින් සඳහා එම බිම් කොටස් ලබා දීම 2015 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර එමගින් ක්‍රියාත්මක කර්මාන්ත සංඛ්‍යාව තව දුරටත් වැඩි කිරිම හා ඒ තුළින් නව රැකියා අවස්ථා ප්‍රමාණය ඉහළ නැංවීමට හැකි වී තිබේ.

දකුණු පළාත තුළ ක්‍රියාත්මක කර්මාන්ත පුර අතරින් ක්‍රියාකාරීව ඉහළ තලයක සිටින මෙම කර්මාන්ත පුරයෙහි තවදුරටත් අවශ්‍ය සංවර්ධන කටයුතු හා යටිතල පහසුම් සම්පූර්ණ කර ආදර්ශ කර්මාන්ත පුරයක් ලෙස වැඩිදියුණු කිරීමට අදාළ සැලසුම් පිළියල කර ඇති අතර එම ව්‍යාපෘති ඉදිරියේදී කර්මාන්ත පුර අයිතියට පැවරීමට නියමිතය. 2017 වර්ෂය සඳහාද කර්මාන්ත පුරයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා කටයුතු සුදානම් කර ඇත.

# දක්ෂිණ අන්තර්ජාතික පොත් ප්‍රදර්ශනය



පොත් කියවීමේ පුරුද්ද සමඟ පොත්පත් පරිහරණයද ක්‍රම ක්‍රමයෙන් ඈත් කරවමින් නූතන තාක්ෂණ විසින් වත්මන් සමාජයේ ඉම් කොන් සීමා පවා සිය දැඩි ග්‍රහණයට නතු කරගනිමින් සිටින අවධියක, පොත් පත් පරිහරණය ජනප්‍රිය කිරීමේ අරමුණ පෙරදැරි කරගනිමින්, සමාජ හා අධ්‍යාපන ක්ෂේත්‍රයන් සංවර්ධනය කිරිම, ග්‍රන්ථ මිළදී ගැනීමේදී පාරිභෝගිකයින් මුහුණ දෙන අපහසුතාවයන් සඳහා විසඳුමක් ලබා දීම හා සාධාරණ මිළ මට්ටමක් තුළ පාරිභෝගික අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම, නූතන තාක්ෂණයේ අහිතකර ප්‍රතිලාභයන් සමාජගතවීම අවම කරලීම සහ ශිෂ්‍යයින්ගේ මෙන්ම සමස්ථ ප්‍රජාවගේම දැනුම වර්ධනය කිරීම උදෙසා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි. පොත් ප්‍රකාශකයින් දිරි ගැන්වීම හා ඔවුන්ගේ ප්‍රකාශනයන් ජනතාව අතරට යාමට අවස්ථාවක් සැලසීම මෙහි තවත් අරමුණක් විය.

මෙමගින් ලැබෙන ආදායම උපයෝගි කර ගනිමින් දකුණු පළාතේ රාජ්‍ය / අර්ධ රාජ්‍ය ආයතන වල සේවයේ නියුතු  වුවන්ගේ උසස් අධ්‍යාපනයට යොමු වූ දරුවන් සඳහා ශිෂ්‍යත්ව අරමුදලක් ගොඩනැගිමත්, පුස්තකාල පහසුකම් නොමැති අතිදුෂ්කර පාසල් සඳහා  පුස්තකාල පොත් ලබාදීමත් පොත් ප්‍රදර්ශනයේ මූලික පරමාර්ථය කර ගනිමින් දකුණු පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක වූ දක්ෂිණ අන්තර්ජාතික පොත් ප්‍රදර්ශනය 2017 ජුනි මස 15,16,17,18 යන දිනයන්හීදි පොත් ප්‍රකාශන ආයතන රැසකගේ සහභාගීත්වයෙන් ගාල්ල මහ නගර ශාලා පරිශ්‍රයේදීපැවැත්විණි.

# දක්ෂිණ සිඟිති සර




දක්ෂිණ සිඟිති සර පෙර පාසල් වැඩ පොත, මෙවර සමස්ත දකුණු පළාතම ආවරණය වන පරිදි ගාල්ල, මාතර හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක 03 සඳහාම බෙදා දීම සිදු කරන ලදි.

# පෙර පාසල් ගුරු ධාරිතා සංවර්ධන වැඩසටහන්

විශේෂ අවශ්‍යතා ඇති දරුවන් හඳුනාගැනීම හා ඔවුන්ගේ කුසලතා සංවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් හික්කඩුව, ගාල්ල, කරන්දෙණිය, ඇල්පිටිය, නියාගම, මාපලගම, බෙන්තොට, අම්බලන්ගොඩ, බලපිටිය, අක්මීමන, නෙළුව, තවලම, යක්කලමුල්ල, බද්දේගම, වැලිවිටිය දිවිතුර, හබරාදූව අධ්‍යාපන කොට්ඨාශ ආවරණය කර ගනිමින් වැඩසටහන් 09 ක් සාර්ථකව ක්‍රියාත්මක කර අවසන් කර ඇත.

# ස්පීඩ් ලෝන්



දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ අරමුදල් සම්පාදනය මත අධිකාරිය හඳුනාගන්නා පුද්ගලයින් සහ සංවිධාන විසින් සිදු කරන විවිධ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ඉතා අඩුපොළී අනුපාතිකයක් යටතේ පහසුවෙන් ලබා ගත හැකි පරිදි ණය පහසුකම් සැලසීම මෙම ණය යෝජනා ක්‍රමයේ අරමුණ වේ.එමඟින් දකුණ පළාත තුළ රැකියා අවස්ථා ජනිත කිරීමත්, සේවා නියුක්තිය වැඩි කර රැකියා වියුක්තිය අඩු කිරීමත් ආදායම් උත්පාදනයත් අරමුණු කෙරෙන අතර මෙහි අවසන් ප්‍රතිඵලය වශයෙන් පළාතේ නිෂ්පාදනය වැඩි කිරීමත්. ආර්ථික තත්වය දියුණු වීමත් අපේක්ෂා කෙරේ.

මෙම ණය වැඩ සටහන යටතේ 2016 වර්ෂය තුළ පෙර පාසල් සංවර්ධන හා මල් වගා සංවර්ධනය සඳහා ප්‍රතිලාභින් 158 දෙනෙකුගේ ස්වයං රැකියාවන් නගා සිටුවීම සඳහා රු.5468000ක ණය මුදලක් ලබා දී ඇත.

ව්‍යවසායකයින් සඳහා අවශ්‍ය දැනුම හා පුහුණුව ලබාදීම ඉලක්ක කොට ගත් "ව්‍යාපාර ශිල්ප" වැඩ සටහන ක්‍රියාත්මක කිරීම හරහා ව්‍යවසායකයින් සවිබල ගැන්වීම.

මධ්‍යම ප්‍රාන්තික පවුල් සඳහා සූර්ය බල ශක්ති වැඩ සටහන ක්‍රියාත්මක කිරීම.

ජීව වායු උත්පාදන ව්‍යාපෘතිය තව දුරටත් ව්‍යාප්ත කරමින් ව්‍යාපාරික ප්‍රජාව මේ සඳහා යොමුකර ගැනීම. (හෝටල් ක්ෂේත්‍රය වැනි)

දක්ෂිණ සිශිතිසර පෙර පාසල් ක්‍රියාකාරකම් අත්පොත සමස්ථ දකුණු පළාතේම දරුවන්ට ලබා දීම හා ඒ තුලින් දරුවන්ගේ හැකියාවන් වර්ධනය කරලීම.

දක්ෂිණ අන්තර් ජාතික පොත් ප්‍රදර්ශනය පවත්වමින් රාජ්‍ය අර්ධ රාජ්‍ය නිලධාරීන්ගේ දරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව අරමුලක් පිහිටුවීම.

පෙර පාසල් ගුරු ධාරිතා සංවර්ධනය තුලින් දරුවන්ගේ පූර්ව ළමා විය සංවර්ධනය විධිමත් කිරීම.

දහම් ගුරු ධාරිතා සංවර්ධනය තුලින් දරුවන්ගේ දහම් අධ්‍යාපනය විධිමත් කරලීම.

**Speed Lone** ව්‍යාපෘතිය තුලින් දකුණු පළාතේ ස්වයං රැකියා නියුක්තිකයින්ට සහන ණය ලබා දෙමින් ඔවුන්ගේ ආර්ථික තත්වය නගා සිටුවීම.

කොරටු වගා ව්‍යාපෘතිය මගින් දකුණු පළාතේ ගෙවතු වගා ආරම්භ කිරීම හා ඔවුන්ගේ ආර්ථිකය නගා සිටුවීම උදෙසා ඔවුන් දිරිගැන්වීම.

# දකුණු පළාත්
# මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

## දැක්ම

**ජාතික ප්‍රමිතීන්ට අනුකූලව දකුණු පළාතේ මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම විශිෂ්ටත්වයෙන් පවත්වා ගැනීම**





දකුණු පළාතේ මගී ආරක්ෂාව හා පරිසර සුරක්ෂිතතාව තහවුරු කිරිමට අදාලව සියළුම මෝටර් රථ ජාතික ප්‍රමිතීන්ට අනුකූලව සුරක්ෂිත වන බවට වග බලා ගැනීම හා මෝටර් රථ හිමියන්ට කාර්යක්ෂමව බලපත්‍ර නිකුත් කිරිම හා ඒ සඳහා අවශ්‍ය මඟ පෙන්වීම හා අධීක්ෂණය යන මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා දකුණු පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ ඒකාබද්ධව මෝටර් රථ ආදායම් බලපත්‍ර නිකුත් කිරිම සහ වෙළඳ වාහන සඳහා යෝග්‍යතා සහතික ලබාදීමට අදාල කටයුතු අධීක්ෂණය තුළින් ආරක්ෂිත ප්‍රවාහන පද්ධතියක් පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කිරිම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යය වේ.

| අංකය | කාරණය | 2016 (රු. මිලියන) | 2017 ජුනි දක්වා (රු. මිලියන) |
|---|---|---|---|
| 01 | මෝටර් රථ ආදායම් බලපත්‍ර අන්තර් ජාලයෙන් නිකුත් කිරීමෙන් ලද ආදායම | 6.72 | 5.83 |
| 02 | දකුණු පළාත තුළ මෝටර් රථ ආදායම් බලපත්‍ර නිකුත් කිරීමෙන් ලබා ගත් ආදායම | 1057.00 | 420.14 |





නවීකරණය කරන ලද මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල දකුණු පළාත් ගරු ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා මැතිතුමාගේ සුරතින් 2017 නොවැම්බර් 13 දින විවෘත කෙරුණි.



# අමාත්‍යාංශය ලබාගත් ජයග්‍රහණ

## ක්‍රීඩා



2016 පළාත් ශූරතාවය




2017 පළාත් ශූරතාවය

## ඵලදායිතා



අන්තර් පළාත් අමාත්‍යාංශ
දෙවන ස්ථානය (2015)




ඵලදායිතා සහතිකය



අන්තර් පළාත් අමාත්‍යාංශ
දෙවන ස්ථානය (2016)

## ISO තත්ත්ව සහතිකය



